
# ක්‍රීඩා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015



#09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07

**පටුන** **පිටු අංකය**


| | |
|---|---|
| 01. ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ පණිවුඩය | 3 |
| 02. ගරු ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 4 |
| 03. ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | 5 |
| 04. ක්‍රීඩා අමාත්‍යාංශය | 7 |
| 05. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | 40 |
| 06. ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 51 |
| 07. වැය විස්තර | 70 |
| 08. විසර්ජන ගිණුම | 83 |



## ගරු ක්‍රීඩා අමාත්‍යතුමන්ගේ පණිවුඩය

ක්‍රීඩාව තුළින් නීතිගරුක හා විනයගරුක සමාජයක් ගොඩනැගීමේ, නිරෝගිමත් හා යහපත් ශරීර සුවතාවයෙන් යුතු ජනතාවක් බිහි කිරීමේ ප්‍රමුඛ වගකීම ක්‍රීඩා අමාත්‍යාංශය සතු වේ. මේ සඳහා ක්‍රීඩාව ජනගත කිරීම, ක්‍රීඩාව සමාජයේ සෑම පැතිකඩක් තුළම ව්‍යාප්ත කිරීම හා ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ. "සැමට ක්‍රීඩා" යන තේමාව සවිබල ගැන්වීමත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමත් තුළින් සුවය, සතුට හා ජයග්‍රහණය තුළින් ලක් පොළොව එකම ක්‍රීඩා පිටියක් කිරීම අපගේ අරමුණයි.

සියළුම පළාත් හා දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රීඩාපිටි ආරම්භය, සංවර්ධනය, වැඩ නිම කිරීම සහ යටිතල පහසුකම් දියුණු කිරීම මූලික අදියරේදි සිදු කරනු ලබයි. තවද හතලිස්තුන් ලක්ෂයක් පමණ වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනා ගැනීමේ වැඩසටහන් ආරම්භ කර ඇත. මෙහිදී සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යංශවල සහයද ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. තවද ක්‍රීඩා විද්‍යා ආයතනයේ ධාරිතාව වැඩි කිරිම තුළින් නවීන විද්‍යාත්මක දැනුමැති ක්‍රීඩා නිලධාරීන් බිහිකිරීම සඳහා ක්‍රීඩා පාඨමාලා ආරම්භ කර ඇති අතර එය උසස් මට්ටම දක්වා වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

එපමණක්ද නොව සියලුම ලාංකිකයන් ක්‍රීඩාවට යොමු කර ගැනීම හා ඔවුන්ගේ අවධානය දිනා ගැනීමද අපගේ තවත් අරමුණකි. මේ සඳහා ප්‍රාදේශීය මට්ටමින් හා නගරාශ්‍රිතව ඇවිදින මංතීරු හා ව්‍යායාම් උයන් ඇති කිරීම මෙහි මූලික පියවරයි. මෙලෙසින් ක්‍රීඩාව තුළින් සෞඛ්‍යමත් නිරෝගි කාර්යක්ෂම ජනතාවක් බිහි කිරීම තුළින් රටේ සංවර්ධනයට දායක වීමට ලැබීම අප ලද භාග්‍යයක් සේ සලකමි.

මේ සියලුම ක්‍රියාමාර්ග තුළින් අපේක්ෂා කරනුයේ ලංකාව තුළ ක්‍රීඩාව ස්ථාපිත කොට ඒ තුළින් නව ලොව වෙත පා තැබීමත් ලක් මව රනින් බැබළවීමත්ය. මෙම ඉලක්ක කරා යාම සඳහා කැපවී ක්‍රියා කරන ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්තුමාත්, සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ කැපවීම අගය කරන අතර මේ සියලු දෙනාටම මාගේ කෘතවේදිත්වය පුද කර සිටිමි.

**දයාසිරි ජයසේකර**

ක්‍රීඩා අමාත්‍ය



**ගරු ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය**

ක්‍රීඩාව වනාහි ඕනෑම රටක් සම්බන්ධයෙන් ප්‍රබල ජාත්‍යන්තර ප්‍රතිරූපයක් ගොඩනැඟීමට ඉවහල් වන්නාවූ අද්විතීය මාධ්‍යයකි.

ක්‍රීඩකයින් විසින් ක්‍රීඩාව තුළ තම වගකීම් ප්‍රශස්ත ලෙස ඉටු කරන්නේ නම් ක්‍රීඩාවේ ප්‍රගතියක් අත්කර ගැනීමට නම් ඊට යටිතල පහසුකම්, විවාදාත්මක කරුණු පිළිබඳ සුවිශේෂී දැනුම මෙන්ම සහජීවනය සඳහා ඉඩ ප්‍රස්ථා වැනි සාධනීය සම්පත් ඊට අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් ගත් කළ ශ්‍රී ලංකාව නිපුණතා සංවර්ධනය මේ වන විටත් අත්කරගෙන ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රීඩා කෞශල්‍යයෙන් ඉදිරි අනාගත විශිෂ්ඨතාවන්ට මං පෙත් විවර වනු ඇත. ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ස්ථිරසාර සහ විශේෂිත මඟපෙන්වීමක් සලසනු ලබන්නේ නම් ඕනෑම ක්‍රීඩා ක්ෂේත්‍රයක ඵලදායිතාව සාක්ෂාත් කර ගැනීමට එයින් මහත් පිටුබලයක් ලැබෙනු ඇත.

මෙම උදාර අරමුණු කරා ලංවීම තුළින් ජීවිතයේ සෑම අංශයක්ම සෞභාග්‍යයේ මාවත කරා අචල ලෙස යොමු කළ හැකි වූද උදෙ‍යෝගී හා ක්‍රියාශීලි මිනිසුන්ගෙන් සමන්විත ප්‍රමෝදිත ජන සමාජයක් බිහි කළ හැකි වනු ඇත. මුළු මහත් පරිසරයම ජීවත්වීම සඳහා සුදුසු සාමකාමී හා මිත්‍රශීලි වටපිටාවක් බවට ජන සමාජය පරිවර්තනය කරමින් නවීනතම හා ශිෂ්ඨ සම්පන්න සමාජයක් බිහිවන්නේ ඉන් ඉක්බිතිවය. මෙම අරමුණුවල අපේක්ෂිත පරමාර්ථය වන්නේ මනුෂ්‍ය වර්ගයා සඳහා ප්‍රීතිමත් හා සෞඛ්‍ය සම්පන්න ගෝලීය ගම්මාන බිහි කිරීමය. සතුරු ආකල්ප වලින් යුත් මානී පරිසරයක් තුළ වූ ද්වේශසහගත ගුණාංග එමඟින් දුරු වී යනු ඇති අතර ඉහළ නැංවුණු ක්‍රීඩා සංස්කෘතියක් තුළින් හෘදයාංගම වූද උදෙ‍යෝගිමත් වූද අපේක්ෂාවන් එයින් මල්පල ගැන්වෙනු ඇත.

**එච්.එම්.එම්. හාරිස්**
ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය



**ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය**

ක්‍රීඩාව අද සමාජය තුළ මහත් උනන්දුවක් දක්වන විෂයකි. එය දේශීය වශයෙන්, කලාපීය වශයෙන් හා ගෝලීය වශයෙන් ද එකසේමය. ඊට සරිලන පරිදි ශ්‍රී ලංකාව තුල සියලු ක්‍රීඩාවන් ප්‍රචලිත කිරීම, ප්‍රමිතිගත කිරීම හා ජාත්‍යන්තර ජයග්‍රහණ උපරිමව අත් කර ගැනීම දක්වා බල ගැන්වීම ක්‍රීඩා අමාත්‍යාංශයේ වගකීම බවට පත්ව ඇත.

ක්‍රීඩාව මානව ක්‍රියාකාරකම් අරභයා විවිධ ආකාරයෙන් සම්ප කළ හැකි සංවේදී විද්‍යාවකි. වයස් බේදයකින් තොරව බාල, තරුණ, මහළු සියළුම පුද්ගලයන්ගේ නිරෝගී පැවැත්ම උදෙසා ක්‍රීඩාව සමාජය තුල හැසිරවිය හැකි අතර මේ සඳහා නිවැරදි මග පෙන්වීමක් සිදු කිරීම අප සතු යුතුකමකි.

එසේම, ක්‍රීඩාව යනු අප රටට පහසුවෙන් ආර්ථික වටිනාකමක් එක්කළ හැකි ක්‍රියාවකි. ශ්‍රී ලංකාවේ පවතින යහපත් දේශගුණය, පවත්නා යටිතල පහසුකම් සහ ස්ථානීය යෝග්‍යතාව මත විවිධ ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් ශ්‍රී ලංකාව තුළ පවත්වමින් විදේශ විනිමය උපයා ගැනීමට මාවත විවර කළ හැකිය. ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාව කර්මාන්තයක් ලෙස දියුණු කරලමින් ආර්ථිකය තුළ නව රැකියා සඳහා ඉඩ ප්‍රස්ථාවන් වර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන්නන් අතර ක්‍රීඩාව මූලික ස්ථානයකට ගෙන ඒම, ක්‍රීඩාව සඳහා සහභාගිවන්නන්ට අවශ්‍ය දැනුම, අවකාශය සහ අවස්ථාවන් සැලසීම, ක්‍රීඩාව ඉහළ තලයට නැංවීමට අවශ්‍ය සහය දීම තුළින් ශ්‍රී ලාංකිකයන් ක්‍රීඩා හැකියාව ඇති ජාතියක් බවට ජාත්‍යන්තර ප්‍රතිරූපයක් ලබාදීම, අප විසින් සපුරා ගත යුතුව ඇති මූලික අරමුණු වේ. ඒ සඳහා අවස්ථාව හා පහසුකම් සලසාදීම ක්‍රීඩා පරිපාලකයින් වන අපගේ වගකීමක් කොට සලකන්නෙමි.

ඒ අනුව, මුහුදු මට්ටමේ සිට අඩි 3000ක උසක පුහුණුවීම් සිදු කල හැකි ඉහළ උන්නතාංශ පුහුණු මධ්‍යස්ථානයක් නුවරඑළියේ ඉදිකර එය ජාත්‍යන්තර තලයේ පහසුකම් ඇති ක්‍රීඩා සංකීර්ණයක් බවට පත් කිරීම, 2024 ඔලිම්පික් තරඟාවලිය ඉලක්ක කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේද සම්පූර්ණ සහයෝගය ඇතිව දිවයින පුරා පාසල්වලින් හඳුනාගත් සිසුන් 375,000කගේ දක්ෂතා හඳුනාගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, පාසල්වලින් ඉවත්ව යන ක්‍රීඩාවට දක්ෂ දරුවන්, ක්‍රීඩා සංවර්ධන සංචිතයට ඇතුලත් කර ගනිමින් දිස්ත්‍රික්කය පුරා ක්‍රීඩා සංවර්ධන සංචිත ඇතිකර ගැනීමටද දිස්ත්‍රික්ක සංචිත, පළාත් සංචිත ඇති කර ගනිමින් ඉදිරි කාලයේදී ඔවුන් රැකබලා ගැනීමට කටයුතු කිරීම, රට පුරා ඇවිදීමේ මංතීරු ඉදිකර එමගින් ජනතාවගේ ශරීර සුවතාවය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම, සියලු පහසුකම් සපිරි ක්‍රීඩා රෝහලක් ඉදිකිරීම, “සැමට ක්‍රීඩා” තේමාව යටතේ ගම් මට්ටමේ කුඩා ක්‍රීඩා සමාජයේ සිට

ජාත්‍යන්තර ක්‍රීඩා සම්මේලන දක්වා ජාලගත කර නිසි සබැඳියාවක් ගොඩ නැගීම යන කරුණු 2016 වර්ෂය තුළදී ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සපුරා ගැනීමට අපේක්ෂිත මූලික අරමුණුය.

"ක්‍රීඩාව" ක්‍රීඩාව සඳහා ම පමණක් නොව, උපරිම ජයග්‍රහණ හිමිකර ගනිමින්ම අපේ දේශය තුල නිරෝගී ජනතාවක් බිහිකිරීම, පෞරුෂ වර්ධනය, ආත්ම විශ්වාසය හා විනයගරුක සමාජයක් බිහිකිරීම හා ජාතික හා ජාත්‍යන්තර සමගිය හා මිත්‍රත්වය තහවුරු කරගැනීම යන තුන්වැදෑරුම් කාරණා ඉටු කර ගැනීමටද අපේ ක්‍රීඩාව හා ක්‍රීඩා සංස්කෘතිය ඉවහල් කර ගැනීම ක්‍රීඩා අමාත්‍යාංශයේ වගකීමක් වන අතර මේ සඳහා අප සැමගේ සමාජ හා වෘත්තීය වගකීම ඉටු කිරීම සඳහා නොඅඩු සහයෝගය ලැබේවායි සුභාශිංශන ගෙන එමි.

**ආචාර්ය ඩී.එම්.ආර්.බී. දිසානායක**
ලේකම්
ක්‍රීඩා අමාත්‍යාංශය

# ක්‍රීඩා අමාත්‍යාංශය

## හැඳින්වීම

මානව පරපුර ලොව බිහිවූදා පටන්ම සමාජයේ විශේෂ වටිනාකමක් ලැබී ඇති ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩාව හැඳින්විය හැක. අතීතයේ දිය කෙළිය, දඩයම, දුනු විදීම, ශක්තිය උරගා බැලීම, සතුන් යොදා ගනිමින් ක්‍රීඩා තරඟ පැවැත්වීම සිදු විය. එක් එක් සත්වයින්ගේ ක්‍රියාකාරකම් ආශ්‍රිතව ක්‍රීඩා තරඟ නිර්මාණය වූ අතර මානවයාගේ දියුණු ශිල්ප ක්‍රම, සමාජ විපර්යාස, ආකල්ප සංවර්ධනය, තාක්ෂණයට නැඹුරු වීම වැනි සාධක පදනම් කරගෙන ක්‍රීඩාවට සමාජ වටිනාකමක් ලබා දෙනු ලැබීය. ඒ අනුව ලෝකයේ විවිධ කලාපවල ජීවත්වන පිරිස විසින් එම ප්‍රදේශ ආශ්‍රිතව නීති රීති සාරධර්ම උපයෝගී කරගනිමින් ආවේනික ක්‍රීඩා හඳුන්වාදුන් අතර ඒ තුළින් නිරෝගී බව, ශරීර සමබරතාවය, සමාජ සංවරය කණ්ඩායමක් ලෙස ඒකරාශී වීම, විඳ දරා ගැනීම, ඉලක්කයක් කරා ක්‍රම ශිල්ප අනුගමනය කරමින් ගමන් කිරීම සිදු විය. ක්‍රීඩාවේ නිරත වීම තුළින් සමාජ පිළිගැනීමක් ඇති වීම වැනි මැස්ලෝගේ අවශ්‍යතා ධුරාවලියේ ඉහළ අවශ්‍යතා ඉටුවීම අද දැකිය හැකි වේ. ඒ අනුව මානව ක්‍රියාකාරකම් හා බැඳුණු ක්‍රීඩාව ලොව පුරා වැදගත් විෂයක් බවට පත් වී ඇත. 1966දී ජනසතු සේවා අමාත්‍යාංශයේ විෂයක් ලෙස ක්‍රීඩාව හඳුනාගනිමින් ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට වටිනාකමක් එක් කරන ලදී. 1967දී ප්‍රථම ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස වී.ඒ. සුගතදාස මහතා පත් කරන ලදී. 1970දී ක්‍රීඩා හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිහිටවනු ලැබීය. වරින්වර ක්‍රීඩා විෂය විවිධ ක්ෂේත්‍ර හරහා මහජනතාවට සමීපව ක්‍රියාකරනු ලැබීය. 1989දී යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසින්ද, 2000දී සංචාරක කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසද, 2003දී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසද, 2004දී ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය ලෙසද, 2007දී ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය ලෙසද, 2010දී ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසින්ද 2015 යළිත් රජයේ දින 100 වැඩ සටහන යටතේ සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසද 2015 අගෝස්තු මස පාර්ලිමේන්තු මැතිවරණයෙන් බිහි වූ රජයේ ක්‍රීඩා අමාත්‍යාංශය ලෙසද ක්‍රියාත්මක වේ.

## ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යයන්

2015.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් මෙසේය :

1. ක්‍රීඩා විෂයට හා අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම

3. ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩ නැගීම සඳහා ක්‍රීඩාව යොදාගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

5. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදුකිරීම

6. ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවලට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු

7. ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා අධීක්ෂණය කිරීම

උක්ත කාර්යභාරය ඉටුකිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ආයතන කිහිපයක් පිහිටුවා ඇත.

1 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
2 සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
3 ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
4 ක්‍රීඩා වෛද්‍ය ආයතනය
5 ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය

**ක්‍රියාත්මක කළ යුතු නීති**

- ක්‍රීඩා නීතිය (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, ඉහතින් සඳහන් කළ කාර්යයන් හා ඉහත ආයතනයන්හි විෂයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

## ක්‍රීඩා අමාත්‍යාංශයට අනන්‍ය වූ දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

ක්‍රීඩාවෙන් ආසියාවේ ප්‍රමුඛ දේශයක් වීම

### මෙහෙවර

ක්‍රීඩාවේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම තුළින් සෑම පුරවැසියෙකුම උද්‍යෝගිමත්, නිරෝගි, විනයගරුක, අභිමානවත් පුද්ගලයෙකු බවට පත් කිරීමෙන් එක්සත්, සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟිම

### අභිමතාර්ථ

01. ශ්‍රී ලාංකීය සංස්කෘතියේ හා සමාජයේ ක්‍රීඩාව අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් කිරීම
02. සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්වය උසස් කර ගැනීමට ශාරීරික සුවය හා සෞඛ්‍යය දියුණු කර ගැනීම සඳහා ක්‍රීඩාව උපයෝගි කර ගැනීම
03. සෑම කෙනෙකුටම ක්‍රීඩාවට සහභාගි විය හැකි වන පරිදි ඒ සඳහා අවශ්‍ය දැනුම ඉඩකඩ හා අවස්ථා සලසා දිම
04. ක්‍රීඩාව සමස්ථයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා යටිතල පහසුකම් ලබා දිම
05. ශ්‍රී ලංකාව ක්‍රීඩා කෞශල්‍යයෙන් ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති ප්‍රතිරූපය ඉහළ නංවාලිම
06. ක්‍රීඩා කර්මාන්තය දියුණු කර නව රැකියා මාර්ග බිහි කර ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම

**ඉලක්ක හා කාර්ය සාධන දර්ශක**

| # | ඉලක්ක | කාර්ය සාධන දර්ශක |
|---|---|---|
| 01 | ක්‍රීඩා සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සම්පාදනය | 2020 වන විට පළාත් නවය තුළ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත පළාත් ක්‍රීඩා සංකීර්ණ 9ක් ඉදිකිරීම |
| 02 | ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීම | වාර්ෂිකව ජාත්‍යන්තර තලයේ පදක්කම් 50ක් දිනා ගැනීම |
| 03 | ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආර්ථිකයක් ගොඩනැගීම | 2020 වන විට වාර්ෂික දළ ජාතික නිෂ්පාදිතයට ඩොලර් මිලියන 500ක දායකත්වයක් ලබා දීම |
| 04 | ක්‍රීඩා සංස්කෘතියක් තුළින් කායික හා මානසික නිරෝගී පුරවැසියන් බිහිකිරීම | 2020 වන විට බෝ නොවන රෝග වැළදීම 1% කින් අඩු කිරීම |
| 05 | ක්‍රීඩා විද්‍යාවේ භාවිතය තුළින් මානව සම්පත් සංවර්ධනය | ජාත්‍යන්තර මට්ටමේදී ක්‍රීඩාවට සම්බන්ධ වන මානව සම්පතෙහි ජාත්‍යන්තර සහභාගීත්ව ප්‍රතිශතය 10% කින් ඉහළ නැංවීම |
| 06 | ක්‍රීඩාව තුළින් සාමය සහ සංහිඳියාව ස්ථාපිත කිරීම | 2020 වන විට කොළඹින් බැහැර ක්‍රීඩාවට සම්බන්ධ ප්‍රතිශතය 10% කින් ඉහළ නැංවීම |

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ, ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ පරිපාලන හා මූල්‍ය කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සිදුවන බැවින් එම ආයතන දෙකෙහි ප්‍රගතිය මේ සමග ඉදිරිපත් කර ඇති අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය හා තහනම් උත්තේජක නිවාරණ නියෝජිත ආයතනය විසින් වෙනම වාර්ෂික කාර්ය සාධන වාර්ථා ඉදිරිපත් කරන බැවින් එම ආයතනයන්හි ප්‍රගතිය මෙම වාර්ථාව සමග ඉදිරිපත් කර නොමැත.

**එසේම අමාත්‍යාංශයේ කාර්යයන් හා විෂයයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සහ පාලනය ක්‍රමවත්ව හා පහසුවෙන් ඉටු කිරීම සඳහා අංශ කිහිපයක් යටතේ අමාත්‍යාංශ වගකීම් විමධ්‍ය ගත කොට ඇත.**

**සංවර්ධන අංශය**

අමාත්‍යාංශය වෙත පැවරී ඇති විෂයයන් හා කාර්යයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති පාලනය ප්‍රධාන වශයෙන් මෙම අංශයේ කාර්යභාරය වේ. ඊට අමතරව ක්‍රීඩා සංවර්ධනය සහ සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සංවර්ධන අංශයේ කාර්යයන් අතර ප්‍රධාන වේ. තවද අමාත්‍යාංශය යටතට ගැනෙන අණපනත් වලට අදාළ සියලු නෛතික කටයුතු ද සංවර්ධන අංශයේ කාර්යයන් අතර වේ. එසේම ක්‍රීඩාව හා බැඳුණු දේශීය විදේශීය ගිවිසුම් ක්‍රියාත්මක කිරීමද මෙම අංශය විසින් කළ යුතු කාර්යයන් වේ.

**සැලසුම් අංශය**

අමාත්‍යාංශය සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රතිපාදන අතුරින් සංවර්ධන අරමුණු සාක්ශාත් කරගැනිම සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීම, එය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය මැන බැලිම හා ප්‍රගති වාර්තා සැකසීම, ඇගයීම් හා මෙහෙයවීම් සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. එසේම ප්‍රතිපත්තිමය තිරණ ගැනිම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට, තිරණ ගන්නා පාර්ශවයන්ට සහ ඉහළ කළමනාකරණයට අවශ්‍ය නිවැරදි තොරතුරු සම්පාදනය සහ මඟ පෙන්වීම සැලසුම් අංශයේ කාර්යයන් අතර ප්‍රධාන වේ.

**පරිපාලන අංශය**

අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණය, මෙහෙයවීම, ඇගයීම සහ අවශ්‍ය පුහුණුවීම් සඳහා යොමුකිරීම, අභ්‍යන්තර පරිපාලනය හා භෞතික සම්පත් පාලනය මෙම අංශයේ ප්‍රධාන කාර්ය වේ. එසේම අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අංශ හා ආයතනවල නිලධාරීන්ගේ මානව සම්පත් කළමනාකරණ අවශ්‍යතා හඳුනාගැනීම, සේවක විනය පාලනය සහ ඒ අනුව අදාල සේවාවන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය ද, අමාත්‍යාංශයට අදාළ අධිකරණ සම්බන්ධ කටයුතු ද ප්‍රවාහන සේවා සහ වාහන නඩත්තු කිරීම පරිපාලන අංශය මගින් ඉටු කරනු ලබයි.

**ගිණුම් හා මූල්‍ය අංශය**

අමාත්‍යාංශය සඳහා වාර්ෂිකව වෙන්වන මූල්‍ය ප්‍රතිපාදන එම අනුමත කාර්යයන් සඳහාම යොදවමින් මූල්‍ය කළමනාකරණය, පාලනය ඒ සම්බන්ධ ලේඛන පවත්වා ගැනීම, මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්ය වේ. එසේම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි එකී කාර්යයන් අධීක්ෂණය, සම්බන්ධීකරණය සහ අවසාන වාර්තා පිළියෙල කිරීම ද මූල්‍ය අංශයේ කාර්යයන් අතර වේ. එසේම ක්‍රීඩා සංවර්ධන අරමුදලේ මූල්‍ය කළමනාකරණය ද අමාත්‍යාංශ මූල්‍ය අංශය මගින් සිදු කෙරේ.

**ක්‍රීඩා අංශය**

ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ජාතික ක්‍රීඩා අරමුදල යෙදවීම, මෙහෙයවීම, ප්‍රගති පාලනය හා විදේශිය තරඟ සඳහා සහ පුහුණුවීම් සඳහා සහභාගි වන දේශිය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රාජ්‍ය අනුග්‍රහය හා පහසුකම් සපයාදීම මෙම අංශයේ කාර්යයන් අතර ප්‍රධාන වේ. එසේම ක්‍රීඩා සංගම්/සමමේලන සම්බන්ධීකරණය මෙම අංශයේ වැදගත් කාර්යයන් වේ. තවද රජය විසින් වරින් වර පිරිනමන බදු සහන ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ යෙදවීමද ඉන් ප්‍රතිලාභ ක්‍රීඩක/ක්‍රීඩිකාවන් වෙත ලබා දීමද ක්‍රීඩා අංශය විසින් ඉටු කරනු ලබයි.

**අභ්‍යන්තර විගණන අංශය**

අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින ආයතනයන්හි අභ්‍යන්තර පාලන කටයුතු හා මූල්‍ය කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ඉටු කිරීම සම්බන්ධව අපක්ෂපාති සොයාබැලීම, මඟපෙන්වීම, උපදෙස්දීම හා අවශ්‍ය අවස්ථාවන්හි අමාත්‍යාංශ ලේකම්වරයා වෙත සෘජුවම වාර්තා සැපයීම අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය වේ.

**මාධ්‍ය අංශය**


මාධ්‍ය අංශය විසින් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීමෙහිලා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව විවිධ සමාජ ස්ථර ඔස්සේ වයස් බේදයකින් තොරව තරුණ, බාල හා ජ්‍යෙෂ්ඨ පුද්ගලයන් හා ක්‍රීඩාව බැඳ තැබීමට මාධ්‍ය හැසිරවීම වඩාත් බලවත් වේ. එසේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් තනි තනි පුද්ගලයන් මෙන්ම සමාජ කණ්ඩායම් දැනුවත් කිරීම ක්‍රීඩාවේ ව්‍යවහාරයට යහපත් ලෙස මඟ පාදයි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ක්‍රීඩා වැඩසටහන් ප්‍රචාරය කිරීම, ක්‍රීඩාව ගොඩ නැංවීම සඳහා නිවැරදි මාධ්‍ය භාවිතය, ක්‍රීඩා පිළිබඳ ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම, ක්‍රීඩාවේ නිවැරදි භාවිතය සමඟින් මාධ්‍ය සමුළු පැවැත්වීම, ක්‍රීඩා මාධ්‍යවේදීන් ඇගයීම හා ක්‍රීඩාවට අදාලව දත්ත හා තොරතුරු ඒකරාශි කිරීම මාධ්‍ය අංශයේ කාර්යභාරයන් වේ.

**ප්‍රසම්පාදන අංශය**

2015 මාර්තු මස සිට ප්‍රසම්පාදන අංශය, ක්‍රීඩා අමාත්‍යාංශයේ වෙනම අංශයක් ලෙස ස්ථාපනය විය. ප්‍රසම්පාදන අංශය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයට හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සියළුම භාණ්ඩ මිලදී ගැනිම් හා සේවා සැපයීම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු ඉටු කරනු ලබයි. එහිදී භාණ්ඩ හා සේවා සපයන නියෝජිත ආයතන සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කෙරේ. එසේම අමාත්‍යාංශයට හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවලට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම තහවුරු කෙරේ. සුදුසුකම්ලත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකරන අතර අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමද ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචනයද සිදු කෙරේ. 2015 වර්ෂය තුළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමද ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචනයද සිදු කෙරේ. 2015 වර්ෂය තුළ ප්‍රසම්පාදන අංශය විසින් භාණ්ඩ මිලදී ගැනිම සඳහා දළ වශයෙන් රු.මි. 12.28කද සේවා සැපයීම සඳහා දළ වශයෙන් රු.මි.2.35කද ප්‍රසම්පාදන කටයුතු ඉටු කර ඇත.

**ක්‍රීඩා අමාත්‍යාංශයේ 2015.12.31 දිනට සංවර්ධන ආයෝජන බෙදියාම හා ප්‍රගතිය**

| # | | වෙන්කිරීම(රු මිලියන) | | | 2015.12.31 දිනට වියදම (රු මිලියන) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | මූලධන | පුනරාවර්තන | එකතුව | මූලධන | පුනරාවර්තන | එකතුව | % |
| 1 | ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ කාර්යාලය | 17.03 | 63.82 | **80.85** | 14.82 | 54.55 | **69.37** | **85.80** |
| 2 | ක්‍රීඩා අමාත්‍යාංශය | 461.85 | 278.05 | **739.90** | 327.35 | 151.93 | **479.28** | **64.78** |
| 3 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2,213.30 | 584.02 | **2,797.32** | 1669.02 | 530.07 | **2,199.09** | **78.61** |
| 4 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 285.00 | 131.75 | **416.75** | 137.30 | 131.75 | **269.05** | **64.56** |
| 5 | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | 35.70 | 24.30 | **60.00** | 30.41 | 23.87 | **54.28** | **90.47** |
| 6 | ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 12.40 | 48.63 | **61.03** | 10.34 | 42.30 | **52.64** | **86.25** |
| 7 | ශ්‍රී ලංකා උත්තේජක මර්ධක නියෝජ්‍යායතනය | 8.00 | 20.00 | **28.00** | 1.48 | 16.78 | **18.26** | **65.21** |
| | එකතුව | **3,033.28** | **1,150.57** | **4,183.85** | **2,190.72** | **951.25** | **3,141.97** | **75.10** |



## 2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ කාර්යයන්

1. **අමාත්‍ය මණ්ඩල සංදේශ හා තිරණ ක්‍රියාත්මක කිරීම**

| අනු අංක ය | දිනය | අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශයේ විස්තරය | තිරණය |
|---|---|---|---|---|
| 01 | 2015.02.03 | 15/0048/623/001 | අයි.සී.සී. ලෝක ක්‍රිකට් කුසලානය 2015 සඳහා සහභාගි වන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ප්‍රසාද දීමනා ලබා දීම | ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදන ලබා ගැනීමකින් තොරව අනුග්‍රාහකයින් සහ සුබ පතන්නන්ගෙන් අරමුදල් රැස්කිරීමෙන් ප්‍රසාද දීමනා ගෙවීම අනුමත කර අත. |
| 02 | 2015.02.06 | 15/0075/623/003 | ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවා කාලය දීර්ඝ කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 03 | 2015.02.06 | 15/0074/623/002 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත් කිරීම | 1. එම්.ඩී. රංජනී ජයකොඩි මහත්මිය රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රිය පාලනය පිළිබඳ අමාත්‍යාංශයට මාරු කිරීම<br>2. සුදුසු නිලධාරියෙකු පත් කරන තෙක් වැඩ බලන නිලධාරියෙකු පත් කිරීම<br>3. සුදුසු නිලධාරියෙකු නම් කිරීම |
| 04 | 2015.02.24 | 15/0161/623/005 | සංචාරක සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ උපදේශකවරුන් පත් කිරීම.<br>1. රොහාන් පෙතියාගොඩ මහතා, ජෛව විවිධත්ව විද්‍යාඥ | ජනප්‍රීත් සාලින්ද ප්‍රනාන්දු මහතා වසරක කාලයක් සඳහා උපදේශක තනතුරට පත් කිරීම,<br>රු.60,000ක මාසික දීමනාවක් ගෙවීම<br>අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2. ජනප්‍රිත් සාලින්ද ප්‍රනාන්දු මහතා, නිතිඥ | හිමි ඉන්ධන දීමනාව සහ අනෙකුත් පහසුකම් ලබා දීම |
| 05 | 2015.02.26 | 15/162/623/006 | ශ්‍රී ලංකාව හා පකිස්තාන ජනරජය අතර ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 06 | 2015.02.26 | 15/0160/623/002-1 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත් කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 07 | 2015.03.17 | 15/0269/623/003-1 | ක්‍රීඩා වෛද්‍ය අයතනයට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීම-වෛද්‍ය ඒ.ඒ.ඒ.ඒ. ශිවංක විජේගුණවර්ධන මහතා | අනුමැතිය ලබා දී නැත |
| 08 | 2015.03.18 | 15/0279/623/007 | ශ්‍රී ලංකාව හා කටාර් රාජ්‍ය අතර ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 09 | 2015.04.22 | 15/0482/623/001 | පින්නවල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් සඳහා උපදේශක සේවා ලබා ගත් පරිසර හා කළමණාකරණ ලංකා (පුද්) සමාගම (EML) ආයතනයට ගිවිසුම් ප්‍රකාරව අදාල ගාස්තු ගෙවීම | අනුමැතිය ලබා දී ඇත |
| 10 | 2015.04.22 | 15/0482/623/010 | පින්නවල | අනුමැතිය ලබා දී ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | | | සත්වෝද්‍යානය තුළ කුඩා ක්ෂීරපායි සතුන් අභිජනන මධ්‍යස්ථානයක් හා ජෛව උද්‍යානයක් ඇති කිරීම | |
| 11 | 2015.04.29 | 15/0513/623/012 | හිලෑ අලි ඇතුන් ලියාපදිංචි කිරීම විධිමත් කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 12 | 2015.05.05 | 15/0598/623/013 | කොත්මලේ මහවැලි මහා සෑයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 13 | 2015.05.29 | 15/0800/623/015 | උද්භිද උද්‍යාන භාර අරමුදල- වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 14 | 2015.06.12 | 15/0873/623/017 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් සහ අධ්‍යක්ෂ තනතුරු 03ක් ඇති කිරීම | 1. විද්‍යාත්මක සේවයේ/ දිප ව්‍යාප්ත සේවාවක විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ලෙස පත් කළ හැකි වන පරිදි දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම 2. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය තනතුරු ඇති කර ගැනීමට උපදෙස් ලබා දී ඇත |
| 15 | 2015.06.09 | 15/0799/623/014 | ජාතික ක්‍රීඩා උළෙල 2016 | අනුමැතිය ලබා දී ඇත |
| 16 | 2015.06.11 | 15/0834/623/016 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | සවිස්තර ව්‍යාපෘති යෝජනාවක් ඇගයීම පිණිස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 17 | 2015.06.23 | 15/0799/623/018 | සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකා රජය හා ඉරාක රජය අතර අවබෝධතා ගිවිසුම | අනුමැතිය ලබා දී ඇත |
| 18 | 2015.06.26 | 15/0982/623/019 | ක්‍රීඩා නිලධාරීන් සුදුසු වැටුප් තලයේ පිහිටුවීම | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳව අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කර කොමිෂන් සභාව වෙත දන්වා එම නිර්දේශ වෙනස් කරන්නේ නම් අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දීමට දන්වා ඇත. |
| 19 | 2015.07.06 | 15/1070/623/020 | අදාල සියළුම රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් සංචාරක කර්මාන්ත සඳහා සියළු අංශ හරහා දියත් වන ජාතික ප්‍රතිපත්තියක් (National Cross Sectoral Policy) හා ඒකාබද්ධ සමස්ත සැලැස්මක් (Integrated Master Plan) සකස් කිරීම (2015-2020) | කල් තබා ඇත. |
| 20 | 2015.07.06 | 15/1071/623/021 | කල්පිටිය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම | කල් තබා ඇත. |
| 21 | 2015.07.28 | 15/1197/623/023 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතු අලි ඇතුන් විහාරස්ථාන හා අනෙකුත් ආගමක් | මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථානවල ආගමික කටයුතු සඳහා වෙන් කිරිම | |
| 22 | 2015.09.21 | 15/1295/747/001 | පොදු රාජ්‍ය මණ්ඩලිය යොවුන් ක්‍රීඩා උළෙල-2017 | අනුමැතිය ලබා දී නැත |
| 23 | 2015.09.23 | 15/1325/747/002 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | අනුමැතිය ලබා දී ඇත |
| 24 | 2015.09.30 | 15/1359/747/003 | ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා උපදේශකවරයෙකු පත් කිරීම -දිජ්ති ළමාහේවා මහතා | අනුමැතිය ලබා දී ඇත |
| 25 | 2015.09.30 | 15/1423/747/004 | ක්‍රීඩා කෞශල්‍යයන් සඳහා ප්‍රවේශය සහතික කිරීමේ ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් පත් කර ඇත |
| 26 | 2015.10.30 | 15/1621/747/005 | ක්‍රීඩා වෛද්‍ය ආයතනයට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීම-වෛද්‍ය ඒ.ඒ.ඒ.ඒ. ශිවජක විජේගුණවර්ධන මහතා | අනුමැතිය ලබා දී ඇත |
| 27 | 2015.11.11 | 15/1720/747/006 | තරඟ පාවාදීම වැළැක්වීමේ පනත | ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කිරිම සඳහා නිති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අනුමැතිය ලබා දී ඇත |
| 28 | 2015.11.11 | 15/1720/747/007 | දකුණු ආසියානු ක්‍රීඩා උළෙල -2016 ඉන්දියාව | මුදල් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර අමාත්‍ය මණ්ඩලයට වාර්තා කරන ලෙස දන්වා ඇත |
| 29 | 2015.11.11 | 15/1722/747/008 | ජාතික ක්‍රීඩා විද්‍යායතනය සඳහා | රාජ්‍ය සේවා කොමිෂන් සභා පත්වීමක් බැවින් රාජ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | | | අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම | සේවා කොමිෂන් සභාව සමඟ කටයුතු කරන ලෙස දන්වා ඇත |
| 30 | 2015.11.23 | 15/1835/747/009 | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දී ඇත |

## 2. අභ්‍යන්තර විගණන කටයුතු

2015 අවසාන ගිණුම් සකස් කර විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. 2014 වර්ෂයේ අවසාන ගිණුම් අධ්‍යයනය කර විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ විගණන වාර්තාව 2015 සැප්තැම්බර් 09 දින ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. එහි අනාවරණය කර ඇති කරුණු කෙටියෙන් පහත දැක්වේ.

2.1 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

(අ) 2002 නොවැම්බර් 28 දිනැති අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක හා උපාංග ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.

(ආ) පුද්ගලික පඩිනඩි ලේඛන යාවත්කාලීන කර ඇත

(ඇ) චෙක්පත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත

(ඈ) හානි ලේඛනය නඩත්තු කරන අතර 2014 වර්ෂයට අදාලව කිසිදු හානියක් වාර්තා වී නොමැති බැවින් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවිය

(ඉ) බැරකම් ලේඛණය නඩත්තු කර ඇත

2.2 ගිණුම්

2.2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අධිප්‍රතිපාදනය ඇති නොවන පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ) අයවැය විචලනය

ඒ ඒ මාසවලදී ඉල්ලුම් කරන ලද අග්‍රිම නොලැබීම නිසා සහ සමහර වැය විෂයන්හි ප්‍රතිපාදන අධිතක්සේරු වීම නිසාත් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.

2.2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

කාර්ය අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

2.3 අභ්‍යන්තර විගණනය

කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා මෙම තත්වය ඇති වූ අතර ඉදිරියේදී ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2.4 වත්කම් කළමණාකරණය

ගෙවිය යුතු අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් බැරකම් ඇතිකර ගෙන තිබූ අතර ඊට අදාලව ගෙවීම් සිදු කර ඇත

2.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

මාස 6ට වැඩි චෙක්පත් රජයේ අදායමට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත

2.6 පාඩු හා හානි

ප්‍රතිපූර්ණය කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත

2.7 මානව සම්පත් කළමණාකරණය

2.7.1 ඉදිරියේදී පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.7.2 ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අතිරික්ත පර්යේෂණ නිලධාරී තනතුරේ කටයුතු කළ නිලධාරියා පෝෂණවේදී තනතුරේ රාජකාරි කටයුතු කරනු ලැබේ

2.7.3 ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අනුමත තනතුරු 10ක් සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂම වෙත යවා ඇත

2.8 වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසින් සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියෙන් ලබාගත් සියළුම නිලධාරීන් එම අධිකාරිය වෙත නිදහස් කර ඇත.

2.9 බේරුම් නොකළ බැරකම්

නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

### 3. ජාතික ක්‍රීඩා සංගම් සදහා විදේශ පුහුණුවීම්

2015 වසරේ ජාතික ක්‍රීඩා සංගම් හා සම්මේලන වලින් විදේශ පුහුණු වීම් හා තරඟ සදහා සහභාගි වීම වෙනුවෙන් නිලධාරීන් 641 දෙනෙකු සහ ක්‍රීඩකයන් 1870ක් විදේශ ගත කිරීමට කටයුතු කරන ලදී. එක් එක් සංගම් හා සම්මේලන වලින් විදේශගත වු සංඛ්‍යාව පහත පරිදි වේ.

| සංගමය | නිලධාරීන් | ක්‍රීඩකයන් | මුළු ගණන |
|---|---|---|---|
| ශ්‍රී ලංකා දුනු ශිල්ප සංගමය | 16 | 17 | 33 |
| ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය | 22 | 51 | 73 |
| ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සම්මේලනය | 13 | 68 | 81 |
| ශ්‍රී ලංකා බර ඉසිලීමේ සම්මේලනය | 32 | 36 | 68 |
| ශ්‍රී ලංකා ජුඩෝ සංගමය | 22 | 34 | 56 |
| ශ්‍රී ලංකා ටෙනිස් සංගමය | 0 | 6 | 6 |
| ශ්‍රී ලංකා වුෂු සම්මේලනය | 12 | 15 | 27 |
| ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය | 07 | 106 | 113 |
| ශ්‍රී ලංකා චෙස් සම්මේලනය | 04 | 29 | 33 |
| ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය | 69 | 223 | 292 |
| ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය | 96 | 278 | 374 |
| ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | 04 | 17 | 21 |
| ජාතික රයිෆල් සංගමය | 5 | 31 | 36 |
| ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය | 23 | 48 | 71 |
| ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය | 11 | 17 | 28 |
| ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය | 9 | 49 | 58 |
| ශ්‍රී ලංකා සම්ප්‍රදායික කරාතේ සම්මේලනය | 5 | 5 | 10 |
| ශ්‍රී ලංකා බොක්ෂිං සංගමය | 33 | 26 | 59 |
| ශ්‍රී ලංකා බාස්කට්බෝල් සම්මේලනය | 8 | 34 | 42 |
| ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය | 5 | 17 | 22 |
| ආබාදිතයින්ගේ ජාතික ක්‍රීඩා සම්මේලනය | 13 | 32 | 45 |
| ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා සම්මේලනය | 16 | 42 | 58 |
| ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය | 13 | 25 | 38 |
| ශ්‍රී ලංකා කායවර්ධන සම්මේලනය | 6 | 7 | 13 |
| ශ්‍රී ලංකා කැරම් සම්මේලනය | 3 | 10 | 13 |
| ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය | 16 | 132 | 148 |
| ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය | 57 | 285 | 342 |
| ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | 57 | 105 | 162 |
| ආධුනික බේස්බෝල් සංගමය | 9 | 38 | 47 |
| ජාතික ජිම්නාස්ටික් සංගමය | 2 | 0 | 02 |
| ශ්‍රී ලංකා හොකී සම්මේලනය | 44 | 77 | 121 |
| ජාතික ඔලිම්පික් කමිටුව | 9 | 10 | 19 |
| **එකතුව** | **641** | **1870** | **2511** |

# 4. මානව සම්පත් කළමණාකරණය

## 4.1 2015 වසරේ ක්‍රීඩා අමාත්‍යාංශයේ මුළු සේවක සංඛ්‍යා තොරතුරු

| | |
|---|---|
| 2014.12.31 දිනට සේවක සංඛ්‍යාව | 82 |
| අලුතින් පැමිණීම් (නව පත්වීම්) | 08 |
| ස්ථාන මාරු වී පැමිණීම් | 26 |
| ස්ථාන මාරුවීම් | (24) |
| මුදා හැරීම් | (01) |
| විශ්‍රාම යාම් | 0 |
| 2015.12.31 දිනට සේවක සංඛ්‍යාව | **91** |

## 4.2 මානව සම්පත් සංවර්ධනය

මේ යටතේ ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් පුහුණුවීම් සඳහා යොමු කර ඇති ආකාරය පහතින් දැක්වේ.

| මාසය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව සඳහා යොමු කළ ආයතනය/ස්ථානය |
|---|---|---|---|
| ජනවාරි | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| මාර්තු | රජයේ සේවකයන් දැනුවත් විය යුතු නිති | 03 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | කාර්යාල කළමණාකරණය හා ආකල්ප වර්ධනය | 03 | |
| අප්‍රේල් | වැටුප් පරිවර්තනය | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | පශ්චාත් උපාධි-II | 01 | කැළණිය විශ්ව විද්‍යාලය |
| | ඉංග්‍රීසි භාෂාව | 03 | කොළඹ විශ්ව විද්‍යාලය |
| | දමිළ භාෂාව | 01 | මානව සම්පත් සංවර්ධන ආයතනය |
| | ක්‍රීඩා හා කායික විද්‍යා | 01 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| | ක්‍රීඩා අනතුරු අවම කිරීම | 61 | International Institute of Health (Pvt) Ltd |
| මැයි | මු.රෙ.104 අලාභ වාර්තා කිරීම,හානි | 01 | නිපුණතා සංවර්ධන අරමුදල |

| | | | |
|---|---|---|---|
| | පුරණය හා ගිණුම් තැබීම | | |
| | ස්ලිඩා සහතිකලත් රියදුරු වැඩසටහන | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | රජයේ ගිණුම් පටිපාටිය | 01 | |
| | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | |
| | Diploma in Public Procurement & Contract Administration | 01 | |
| ජූනි | Seminar on Resource Environmnet Protection & Eco Civilization construction for Developing Countries | 02 | චීනය |
| | 2015 Seminar Training Course on Maintenance & Management of Sports Facilities for Counties | 08 | චීනය |
| | විශ්‍රාම වැටුප් කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | වැටුප් පරිවර්තනය | 01 | |
| | රජයේ ගිණුම් පටිපාටිය | 01 | |
| ජූලි | 2015 Seminar on China-South Asia Tourism Co- | 03 | චීනය |

| | | | |
|---|---|---|---|
| | operation & Development | | |
| | Advanced Certificate in English for Professionals | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | Master of Public Administration | 01 | කොළඹ විශ්ව විද්‍යාලය |
| | Next Generation Network Technology & Future Trends | 01 | ඉන්දියාව |
| | Seminar on 19th Amendment to the construction & its effects of public service | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | කාර්යාල කළමණාකරණය හා ආකල්ප වර්ධනය | 01 | |
| අගෝස්තු | හෙද නිලධාරි සහ ඖෂධවේදි නිලධාරි | 02 | KDU |
| | රාජ්‍ය මූල්‍ය කළමණාකරණය | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | කාර්යාල කළමණාකරණය හා ආකල්ප වර්ධනය | 01 | |

| | | | |
|---|---|---|---|
| ඔක්තෝම්බර් | ආයතන සංග්‍රහයේ විධි විධාන කාර්ය පටිපාටි | 01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| දෙසැම්බර් | ආයතන සංග්‍රහයේ විධි විධාන කාර්ය පටිපාටික රීති පිළිබඳ පුහුණු පාඨමාලාව | 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | Out Bound Training Programme | 85 | රන්දෙණිගල |
| | Managing Time for better productivity | 1 | නිපුණතා සංවර්ධන අරමුදල |
| | Training Workshop on Nutrition Research Methodology | 1 | ශ්‍රී ලංකා පෝෂණ සංගමය |

## 4.3 ක්‍රීඩා අමාත්‍යාංශය අනුමත තනතුරු පිළිබඳ තොරතුරු - 2015

| # | තනතුර | නිලධාරි ගණය/ ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | තනතුරු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අනුමත | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | පුරප්පාඩු |
| 1 | ලේකම් | | SL 4 | 1 | 1 | | | 0 |
| 2 | අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන) | ශ්‍රී ලං ප සේ (වි) | SL 3 | 1 | 1 | | | 0 |
| 3 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ (වි) | SL 3 | 1 | 1 | | | 0 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ 1 | SL 1 | 1 | 1 | | | 0 |
| 5 | අධ්‍යක්ෂ ( සංවර්ධන) | ශ්‍රී ලං ප සේ 1 | SL 1 | 1 | 0 | | | 1 |
| 6 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං ක්‍ර සේ 1 | SL 1 | 1 | 1 | | | 0 |
| 7 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංග සේ 1 | SL 1 | 1 | 1 | | | 0 |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංග සේ 1 | SL 1 | 1 | 1 | | | 0 |
| 9 | ගණකාධිකාරී (ගෙවීම්) | ශ්‍රී ලංග සේ II/III | SL 1 | 1 | 1 | | | 0 |
| 10 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ II/III | SL 1 | 1 | 1 | | | 0 |
| 11 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං ක්‍ර සේ II/III | SL 1 | 1 | 1 | | | 0 |
| 12 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | ශ්‍රී ලං ප සේ II/III | SL 1 | 1 | 1 | | | 0 |
| 13 | සහකාර ලේකම් (පාලන) | ශ්‍රී ලං ප සේ III | SL 1 | 1 | 1 | | | 0 |
| 14 | සහකාර ලේකම් (ප්‍රසම්පාදන) | ශ්‍රී ලං ප සේ III | SL 1 | | | | | |
| 15 | නීති නිලධාරී | දෙපාර්තමේන්තු ගත | SL 1 | 1 | 1 | | | 0 |
| 16 | පරිපාලන නිලධාරි | රා ක ස සේ (අධි) | MN 7 | 1 | 0 | 1 | | 1 |
| 17 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක | MN 6 | 1 | | | 1 | 1 |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං තො සං තාක්ෂණ සේවය II | MN 6 | 1 | 0 | | | 1 |
| 19 | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | රු.22500/- | 1 | 1 | | | 0 |
| 20 | ප්‍රවෘත්ති නිලධාරී | තාවකාලික | MN 4 | 1 | 1 | | | 0 |
| 21 | සැලසුම් සහකාර | ආශ්‍රිත නිලධාරී | MN 4 | 1 | 1 | | | 0 |

| # | තනතුර | නිලධාරි ගණය/ ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | තනතුරු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අනුමත | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | පුරප්පාඩු |
| 22 | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේ. | MN 4 | 28 | 26 | | | 2 |
| 23 | තාක්ෂණ නිලධාරි | ශ්‍රී.ලං.තාක්ෂණ සේවය | MN 3 | 1 | 1 | | | 0 |
| 24 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තාක්ෂණ සේවය | MT 1 | 1 | 0 | | | 0 |
| 25 | රාජ්‍ය කළමණාකරණ සහකාර | රා ක ස සේ | MN 2 | 21 | 18 | | | 3 |
| 26 | පිළිගැනිමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN 1 | 1 | 1 | | | 0 |
| 27 | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | MT 1 | 1 | 1 | | | 0 |
| 28 | කැමරා ක්‍රියාකරු | තාවකාලික | MT 1 | 1 | 1 | | | 0 |
| 29 | රියදුරු | රියදුරු සේවය | PL 3 | 14 | 14 | | | 0 |
| 30 | කැමරා සහායක | තාවකාලික | PL 1 | 1 | 1 | | | 0 |
| 31 | කාර්යාල සේවක සේවය | කාර්යාල සේවක සේවය | PL 1 | 10 | 9 | | | 1 |
| | | | | **100** | **89** | **1** | **1** | **11** |

## 5. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

### 5.1 පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම

ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානම සංවර්ධන ව්‍යාපෘතියකි. දිවයින පුරා සෑම පළාතක් සඳහාම ජාත්‍යන්තර පහසුකම්වලින් සමන්විත පළාත් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමටත් එසේ පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදිනොකරන දිස්ත්‍රික් ආවරණය කිරීම සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීමටත් 2011දී අමාත්‍ය මණ්ඩල සංදේශයකින් අනුමැතිය ලබා ඇත. 2011දී ආරම්භ කළ සංකීර්ණ අතුරින් බදුල්ල හා අනුරාධපුර ක්‍රීඩා සංකීර්ණ මහජන අයිතියට පවරා ඇත.

| පළාත් ක්‍රීඩා සංකීර්ණයේ නම | පළාත | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | වර්තමාන තත්වය |
|---|---|---|---|
| බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩා සංකීර්ණය | ඌව | 377.00 | මහජන අයිතියට පවරා ඇත. |
| අනුරාධපුර මහජන ක්‍රීඩා සංකීර්ණය | උතුරු මැද | 300.78 | මහජන අයිතියට පවරා ඇත. |
| දිගන කුණ්ඩසාලේ ක්‍රීඩා සංකීර්ණය | මධ්‍යම | 392.00 | වැඩ අවසන් කර ඇත. |
| කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණය | උතුරු | 254.82 | වැඩ කෙරෙමින් පවතී |
| ත්‍රිකුණාමලය මැකයිසර් ක්‍රීඩා | නැගෙනහිර | 354.00 | ක්‍රීඩාපිටියේ වැඩ |

| | | | |
|---|---|---|---|
| සංකීර්ණය | | | තාවකාලිකව නවතා දමා ඇත. |
| රත්නපුර පොදු ක්‍රීඩා සංකීර්ණය | සබරගමුව | 279.16 | වැඩ ආරම්භ කර ඇත. |
| වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණය | වයඹ | - | සුදුසු භූමියක් තෝරාගැනීමේ කටයුතු සිදුකරමින් පවති. |
| සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය | දකුණ | - | සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා වෙමින් පවති |
| දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය | බස්නාහිර | - | සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා වෙමින් පවති |

## 5.2. දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම

පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම මඟින් ආවරණය නොවන දිස්ත්‍රික් සඳහා අංග සම්පූර්ණ පහසුකම් සහිත දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකරනු ලැබේ.

- දැනටමත් ආරම්භ කර ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ

| # | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | කළුතර බණ්ඩාරගම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 212.29 |
| 2 | පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 196.71 |
| 3 | පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 135.00 |
| 4 | මාතර කොටුගොඩ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 237.43 |
| 5 | මඩකලපුව වෙබර් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 198.17 |
| 6 | අම්පාර සෙනරත් සෝමරත්න දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | 187.76 |

- කොන්ත්‍රාත් පිරිනමා ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ

| | ක්‍රීඩාංගනය | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩාංගනය | 261.90 |
| 2 | ගාල්ල දඩැල්ල ක්‍රීඩාංගනය | 256.05 |
| 3 | වවුනියා මහජන ක්‍රීඩාංගනය | 256.05 |
| 4 | මන්නාරම මහජන ක්‍රීඩාංගනය | 256.05 |
| 5 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩාංගනය | 256.05 |
| 6 | කෑගල්ල දිස්ත්‍රික් ක්‍රීඩාංගනය | 298.46 |

### 5.3. දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සඳහා ආදර්ශ ක්‍රීඩා පිටියක්

දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ආදර්ශයක් නාවලපිටිය ජයතිලක ක්‍රීඩා සකීර්ණයේ ඉදිකරනු ලැබූ අතර එය අද නාවලපිටිය නගරයේ ආර්ථික වටිනාකමක් සහිත ස්ථානයක් වේ. ඒ සඳහා ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 250කි. මේ වන විට ජාතික හා ජාත්‍යන්තර තරඟ නොඅඩු ජයතිලක ක්‍රීඩා සංකීර්ණය සති අන්ත හා නිවාඩු දිනයන්හි වෙන්කර ගැනිමට අපහසු මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත. ප්‍රදේශයේ ක්‍රීඩා සංගමයක් මඟින් මෙහෙයවීම, නඩත්තුව හා පරිපාලන කටයුතු කරන අතර උපයන ආදායමින් අදාල වියදම් ආවරණය කර ගැනිමට ප්‍රමාණවත් වේ. ආපන ශාලාව හරහා තවත් ආදායමක් උපයා ගන්නා අතර ජාතික හා ජාත්‍යන්තර තරඟ පැවැත්වීම නිසා ප්‍රදේශවාසීන්ගේ වක්‍ර ආදයම් මාර්ග උත්පාදනයටද අවස්ථාව උදා වී ඇත.

### 5.4. ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය

දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රීඩා පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර දැනට පාසල් 22ක් තෝරාගෙන ඇති අතර ඉන් 17ක් පමණක් ක්‍රියාත්මක වේ. මින් ජාතික පාසල් 19ක් හා පළාත් සභා පාසල් 03ක් වශයෙන් නියෝජනය වේ. නැගෙනහිර පළාත සඳහා තවත් එක් පාසලක් හා උතුරු පළාත සඳහා පාසල් 02ක් යෝජනා වී ඇත. දැනට විදේශ රටවල පවතින ක්‍රීඩා පාසල් ඇකඩමි සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති මෙම ක්‍රීඩා පාසල් 17ක් පමණක් ක්‍රියාත්මක තත්වයේ පවතී. මේ යටතේ එම පාසල් ආශ්‍රිතව විශේෂ ක්‍රීඩා දක්ෂතා සහිත දූ දරුවන් පුහුණු කිරීම, ඒ අය සඳහා පෝෂ්‍යදායී විශේෂ ආහාරපාන, නේවාසික පහසුකම්, බෙහෙත් සහ අතපසුවන පාඩම් වැඩ සඳහා විශේෂ ගුරුවරුන් මඟින් පාඩම් කියාදීම දැනට ක්‍රියාත්මක වේ. මේ යටතේ 2007 වර්ෂයේ සිට පාසල් 06ක සංවර්ධන කටයුතු පමණක් සිදුවෙමින් පවතී. මේ සඳහා ඉදිරියේදී විශේෂ අවධානය යොමු කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව දැනට අවධානය යොමුවී විවිධ ආකාරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ක්‍රීඩා පාසල් තෝරාගෙන ඇත.

1. දික්වැල්ල විජිත මධ්‍ය මහා විද්‍යාලය - මාතර
2. මාදම්පේ සේනානායක විද්‍යාලය - පුත්තලම
3. රුහුණු විජයබා මධ්‍ය මහා විද්‍යාලය - හම්බන්තොට
4. තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය - කෑගල්ල
5. පිලියන්දල මධ්‍ය මහා විද්‍යාලය - කොළඹ
6. තිස්ස මධ්‍ය මහා විද්‍යාලය - කළුතර
7. වලල ඒ රත්නායක මහා විද්‍යාලය - මහනුවර
8. සීවලී මධ්‍ය මහා විද්‍යාලය - රත්නපුරය

### 5.5 රිඩ් මාවත ක්‍රීඩා සංකීර්ණය

2009 වර්ෂයේදී ආරම්භ කළ මේ ව්‍යාපෘතිය යටතේ කෘතිම හොකි ක්‍රීඩා පිටිය සහ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම, ක්‍රීඩා නේවාසිකාගාරය සහ ග්‍රෑන්ඩ් ස්ටෑන්ඩ් ක්‍රීඩා පිටිය ඉදිකිරීම යන ව්‍යාපෘති හදුනාගෙන තිබූ අතර සම්පූර්ණ ආයෝජන මුදල රුපියල් මිලියන 775කි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හරහා ඉදි කිරීම් සඳහා යෝජනා ලැබුණු අතර කාල පමාව නිසා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ග්‍රෑන්ඩ් ස්ටෑන්ඩ් ක්‍රීඩාගාරය ප්‍රතිනිර්මාණය කළ අතර එම ක්‍රීඩා පිට්ටනිය රගර් පිටියක් ලෙස සංවර්ධනය විය. දැනට ජාත්‍යන්තර මට්ටමේ රගර් තරඟ පවත්වා එම ක්‍රීඩා පිටිය ආසියාවේ වෙළඳ කේන්ද්‍රස්ථානයක් ලෙසින් සංවර්ධනය වන කොළඹ නගරයට අලංකාරයක් මෙන්ම ආර්ථික වටිනාකමක් සපයා ඇත.

ජාත්‍යන්තර හොකි පිටිය සහ ප්‍රේක්ෂකාගාරය දැනට තරඟ පවත්වමින් සහ පුහුණුවීම් කටයුතුවල යෙදෙමින් ප්‍රයෝජනයට ගනු ලබයි. 500කට ආසන්න පිරිසකට තරඟ නැරඹිය හැකි මෙම කෘතිම හොකි පිටිය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබයි. ඊට යාබද තුන්මහල් ක්‍රීඩා නේවාසිකාගාරයෙහි 250 දෙනෙකු සඳහා එකවර නවාතැන් පහසුකම් ලබාදිය හැකි වේ. විදේශීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අගනගරයේ පහසුකම් සහිතව වඩාත් සහනදායි මිලකට නේවාසික විය හැකි මෙම නේවාසිකාගාරය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පාලන හා නඩත්තු කටයුතු සිදු කරයි. එසේම අළුතින් ඉදිවූ නෙට්බෝල් ක්‍රීඩා පිටියේ අඩුපාඩු කිහිපයක් පැවති අතර එය සකසා අවසන් කර ඇත. එසේම එළිමහන් කබඩි පිටියක් ඊට යාබදව ඉදිකිරීමේ වැඩ ආරම්භ කර ඇත.

### 5.6 ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණය

අගනගරයේ පුහුණුවීම් සඳහා පිහිටි ස්වභාවික ක්‍රීඩා පිටිය මෙය වන අතර ජාතික සංචිතයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිනපතා පුහුණුවීම් කටයුතුවල නිරත වේ. මීටර් 400 කෘතිම ධාවන පථයක් එළිමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ක්‍රීඩා සංගම් 48ක් සඳහා කාර්යාල සංකීර්ණය මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට අපේක්ෂිත අතර ක්‍රීඩා සංගම් සඳහා කාර්යාල පහසුකම් ලබා දීමට බලාපොරොත්තු වේ. දැනට ජාතික පාසල්, ජාත්‍යන්තර පාසල් ක්‍රීඩා තරඟ පැවැත්වෙන මෙහි දිනපතා විවිධ ක්‍රීඩා ඉසව් පවත්වමින් ක්‍රීඩාව සඳහා උපරිම උපයෝගිතාවයෙන් කටයුතු කරයි. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නඩත්තු හා පාලන කටයුතු සිදු කරයි.

### 5.7 ග්‍රාමීය ක්‍රීඩාංගන සංවර්ධනය - 2015

ග්‍රමීය ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ 2015 වර්ෂයේදී දිස්ත්‍රික්ක 18ක ක්‍රීඩා පිටි 166ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 239.97ක මුදලක් ලබාදී තිබෙන අතර ග්‍රාමීය ක්‍රීඩාංගන හා පාසල් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. එමෙන්ම ක්‍රීඩා සමාජ 170ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීමද මෙම වර්ෂයේදී සිදු වී ඇත.

| # | දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රීඩා සමාජ සඳහා උපකරණ ලබාදීම | වෙන්කල මුදල (රු. මි.) |
|---|---|---|---|---|
| 1 | නුවරඑළිය | 96 | - | 151.56 |
| 2 | රත්නපුර | 3 | 30 | 2.29 |
| 3 | අම්පාර | 12 | - | 20.00 |
| 4 | අනුරාධපුරය | 3 | - | 4.49 |
| 5 | කොළඹ | 0 | 70 | 0.52 |
| 6 | ගම්පහ | 7 | - | 13.55 |
| 7 | බදුල්ල | 1 | - | 2.00 |
| 8 | කුරුණෑගල | 1 | - | 2.00 |
| 9 | මාතර | 3 | - | 6.00 |
| 10 | මාතලේ | 1 | - | 2.00 |
| 11 | මහනුවර | 6 | - | 4.80 |
| 12 | හම්බන්තොට | 0 | 46 | 0.38 |
| 13 | ගාල්ල | 1 | 1 | 2.20 |
| 14 | කෑගල්ල | 3 | 2 | 4.02 |
| 15 | ත්‍රිකුණාමලය | 0 | 21 | 0.16 |
| 16 | පොළොන්නරුව | 27 | - | 20.40 |
| 17 | පුත්තලම | 1 | - | 2.00 |
| 18 | කළුතර | 1 | - | 1.60 |
| **එකතුව** | | **166** | **170** | **239.97** |

## 6. ක්‍රීඩා කෞතුකාගාරය පිහිටුවීම

ක්‍රීඩාවේ ඓතිහාසික වැදගත්කම අනාගත පරපුරට උරුමකරදීමට මානව විද්‍යාත්මක වැදගත්කමකින් යුතු ක්‍රීඩාව හා බැදි සිහිවටනයන් සංරක්ෂණය කර තබා ගැනීම උදෙසා ජාතික ක්‍රීඩා කෞතුකාගාරය ඉදි කිරීමට අපේක්ෂිතය. මේ සඳහා නිදහස් සටනේ පුරෝගාමිකයෙකු වූ එෆ්.ආර්. සේනානායක මැතිතුමාගේ නිදහස් වතුරශ්‍රය ආශ්‍රිතව පිහිටා ඇති පාම්පරික නිවස යොදා ගැනීම සඳහා අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී.

**මෙම ව්‍යාපෘතියේ අරමුණු**

1. ක්‍රීඩා ඉතිහාසය පිළිබද අනාගත පරපුර දැනුවත් කිරීම, ක්‍රීඩාවේ විද්‍යාත්මක හරයන් හඳුන්වා දීම හා ක්‍රීඩාවේ ලාංකිය සලකුණ උද්දීපනය කොට දැක්වීම
2. ක්‍රීඩා විෂය හා අනුබද්ධ ලිපිලේඛණ ශ්‍රේෂ්ඨ ක්‍රීඩකයන්ගේ ජයග්‍රහණ ශුරතා, පදක්කම් හා සිහිවටන සංරක්ෂණය
3. ශ්‍රී ලාංකිය ක්‍රීඩා කෞෂලයයන් ජාත්‍යන්තර තලය දක්වා දියුණු කිරීම සඳහා ක්‍රීඩා පුස්තකාලයක් ක්‍රීඩා සිනමා ශාලාවක් හා අන්තර්ජාල පහසුකම් ඇති තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම. මෙම පහසුකම් මඟින් ක්‍රීඩාවන්හි නවීන තාක්ෂණික කරුණු, ක්‍රීඩා නීති රීති, ක්‍රීඩා වෛද්‍ය විධික්‍රම සහ අන්තරායකර ඖෂධ පිළිබඳ ස්වයං අධ්‍යයන සඳහා අවස්ථාවක් ලබා දීම.

4. ක්‍රීඩාව තුළින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සවිමත් කිරීමක් වශයෙන් මෙම යෝජිත ජාතික ක්‍රීඩා කෞතුකාගාරය දකුණු ආසියාතික ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය කොට විදේශිකයන්ගේ ආකර්ශණීය ස්ථානයක් බවට පත්කරලීමත් විදේශිකයන්ට නේවාසික පහසුකම්, ක්‍රීඩා පහසුකම් සහිතව ක්‍රීඩා විෂය පිළිබඳ පර්යේෂණ හා අධ්‍යාපන කටයුතු කිරීමේ අවස්ථාව ලබා දීමටත් අපේක්ෂිතය.

5. ශ්‍රී ලාංකිකයන්ගේ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගත් දක්ෂයන්ගේ ජීවමාන ප්‍රමාණයේ පිළිරූ රැගත් ශ්‍රේෂ්ඨයන්ගේ මැදිරියක් පිහිටුවීම.

6. ජාතික ක්‍රීඩා සංගම්වල ඉතිහාසය, පිහිටුවා ඇති වාර්තා සහ අනෙකුත් දත්තයන් එක් රැස් කෙරුණු ක්‍රීඩා දත්ත ගබඩාවක් පිහිටුවීම.

## 7. ජාතික ක්‍රීඩා දිනයක් ප්‍රකාශයට පත් කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ජාත්‍යන්තර ක්‍රීඩා දිනයට සමගාමීව සෑම වසරකම අප්‍රියෙල් 06වන දිනය ජාතික ක්‍රීඩා දිනය ලෙස ප්‍රකාශයට පත් කොට දීප ව්‍යාප්තව ක්‍රියාවට නැංවේ. එහිදී ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ සාම්ප්‍රදායික ක්‍රීඩා, ජාතික ක්‍රීඩා, විනෝදාත්මක ක්‍රීඩා සහ ත්‍රාසජනක ක්‍රීඩා නිවැරදි නීති රීති අනුව ක්‍රීඩාව හැසිරවීමටත් සමාජයේ විවිධ ක්ෂේත්‍ර තුළ ක්‍රීඩාව ජනප්‍රිය කරවීමටත්, ක්‍රීඩාවෙන් ලැබෙන ඵල ප්‍රයෝජන හා වාසි පිළිබඳව සමස්ත ප්‍රජාව දැනුවත් කිරීමත් සිදු කෙරේ. ඒ අනුව මෙවර ප්‍රථම වතාවට ජාතික ක්‍රීඩා දිනය 2015 අප්‍රියෙල් 06 දින ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නුවර එළිය තුරඟ තරඟ පිටියේදී උත්සවාකාරයෙන් පවත්වන ලදී. "ක්‍රීඩාව තුළින් ප්‍රීතිමත් නිරෝගී සාමකාමී ජීවිතයක්" යන තේමාව යටතේ ලෝක සෞඛ්‍ය සංවිධානය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය, නුවර එළිය දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන, නුවර එළිය මහ නගර සභාව සමඟ ඒකාබද්ධව විවිධ වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී නුවර එළිය දිස්ත්‍රික් රාජ්‍ය අංශයේ නිලධාරීන්, පාසල් ළමුන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, දේශපාලඥයන් හා මහජනතාවගෙන් සමන්විත 2000 ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් ක්‍රීඩා දින පා ගමනක් පවත්වන ලදී, තවද මවුන්ටන් පාපැදි තරඟ, මැරතන් තරඟ, සරඹ සංදර්ශණ හා බෝ නොවන රෝග සායනයක් පවත්වන ලදී. එමෙන්ම පාසල් ශාරීරික සුවතා වැඩ සටහන නැවත ආරම්භ කිරීමද මෙහිදී සිදු විය.

## 8. ප්‍රගති සමාලෝචන රැස්වීම්

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලස්මට අනුව අමාත්‍යාංශයේ හා අනුබද්ධිත ආයතනයන්හි ප්‍රගතිය ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ මූලිකත්වයෙන් මාසිකව සමාලෝචනය කළ අතර ලේකම්තුමා විසින් දෙසතියකට වරක් ප්‍රගතිය විමර්ශනය කරන ලදී. ඒ අනුව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකවීමේ කැපීපෙනෙන වේගවත් බවක් ලබාදෙන ලදී. සෑම මසක් අවසානයේම ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අනුබද්ධ අයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුලත් මාසික ප්‍රගති වාර්තා සකස් කරනු ලැබූ

අතර මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රාග්ධන ව්‍යාපෘති සහ රුපියල් මිලියන 50 ට වැඩි ව්‍යාපෘතීන්හි ප්‍රගතිය විද්‍යුත් තැපැල මගින් කාර්තුමය වශයෙන් ඉදිරිපත් කරනු ලැබීය. එසේම සියළුම සංවර්ධන ව්‍යාපෘතීන්හි මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ඇතුලත් සවිස්තර වාර්තාවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සහ අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීය.

## 9. භාණ්ඩ සමීක්ෂණ කටයුතු

2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 8දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩල 4ක් මගින් සිදු කරමින් පවති.

## 10. වාර්ථා ඉදිරිපත් කිරිම්

- ක්‍රීඩා අමාත්‍යාංශයේ 2015 ක්‍රියාකාරී සැලැස්ම සකස්කර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
- ක්‍රීඩා අමාත්‍යාංශයේ 2015 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම.
- 2015 වර්ෂයට අදාළ විගණන සැලැස්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

## 11. සුභ සාධක වැඩසටහන්

**11.1 2015 වර්ෂය තුළ ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුභසාධක හා ක්‍රීඩා සංගමය විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.**

- "දැහැමි සිතුවිලි සමඟ 2015 වසර අරඹමු"තේමාව යටතේ සුමධුර ධර්ම දේශණය - කැළණිය විශ්ව විද්‍යාලයේ සංස්කෘතික අධ්‍යයන අංශාධිපති මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
- 2015.05.12 - වෙසක් ධර්ම දේශණය- පූජ්‍ය නාරංබැද්දේ ආනන්ද සාගර හිමි
- 2015.06.11 - රුධිර පරිත්‍යාග කිරිමේ කඳවුරක් පැවැත්වීම
- Fontera නිෂ්පාදන සහන මිලට ලබා දීම
- දම්රෝ ආයතනයෙන් ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ පහසු ගෙවීමේ ක්‍රමය යටතේ ලබා දීම
- Softlogic ආයතනයෙන් Dell ලැප්ටොප් පරිගණක අලෙවි ප්‍රදර්ශණාගාරයක් පැවැත්වීම
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ සේවා හඳුන්වා දීම
- හිරෝ් අබාන්ස් ආයතනයේ සහන ගෙවීමේ ක්‍රමයක් යටතේ යතුරු පැදි හඳුන්වා දීම
- BOC රාජ්‍ය සේවකයන් සඳහා ණය ලබා දීම පිළිබඳ දැනුවත් කිරීම
- බෝධි පූජාමය පින්කමක් පැවැත්වීම

### 11.2 ක්‍රීඩා අමාත්‍යාංශ සේවක සුබ සාධක සහ ක්‍රීඩා සංගමයේ සාමාජිකයන් හට හදිසි අවශ්‍යතා සඳහා ණය/ආධාර ලබාදීම

ක්‍රීඩා සංගමයේ සාමාජිකයන් 43දෙනෙකු හට හදිසි අවශ්‍යතා සඳහා රු 420,000ක ණය ලබා දී ඇත. එසේම වෛද්‍ය ප්‍රතිකාර සඳහා රු.137600/-ක ආධාර මුදල් ලබා දී ඇත.

### 11.3 2015 වසර සමාරම්භක උළෙල පැවැත්වීම

සංගමයේ සාමාජිකයන්ගේ අනුග්‍රහයෙන් 2015 වසර සමාරම්භක උළෙල ක්‍රීඩා අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා අනුබද්ධිත ආයතන ප්‍රධානීන්ගේද සහභාගීත්වයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයේදී පැවත්වීම.

## ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ - 2015

| තරඟය | ඉසව්ව | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|---|
| ආසියානු යොවුන් මළල ක්‍රීඩා - කටාර් | මීටර් 400 බාධක දිවීම - කාන්තා | 1 | 0 | 0 |
| | මීටර් 400 බාධක දිවීම - පිරිමි | 0 | 1 | 0 |
| | තුන් පිම්ම | 0 | 1 | 0 |
| | උස පැනීම | 0 | 1 | 0 |
| | මීටර් 400 සහාය දිවීම | 1 | 0 | 0 |
| දෝහා විවෘත අන්තර්ජාතික බොක්ෂිං තරඟාවලිය - කටාර්, දෝහා අගනගරය | කි.ග්‍රෑ 91 ට වැඩි සුපර් හෙවි බර පංතිය | 0 | 1 | 0 |
| | කි.ග්‍රෑ 69 වෙල්ටර් බර පංතිය-පිරිමි | 0 | 0 | 1 |
| | කි.ග්‍රෑ 81 ලයිට් හෙවි බර පංතිය | 0 | 0 | 1 |
| ආසියානු ග්‍රෑන්ඩ් ප්‍රික්ස් - බැන්කොක් | මීටර් 800 (ගැහැණු) | 3 | 3 | 0 |
| | 4×100 මීටර් | 0 | 1 | 1 |
| | මීටර් 100 | 0 | 0 | 1 |
| | උස පැනීම | 0 | 0 | 1 |
| | හෙල්ල විසි කිරීම | 0 | 0 | 1 |
| | මීටර් 800 (පිරිමි) | 0 | 1 | 0 |
| 21 වෙනි ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලිය - වුහන් | මීටර් 800 (ගැහැණු) | 0 | 0 | 1 |
| තායිලන්ත විවෘත මලල ක්‍රීඩා තරඟාවලිය | මීටර් 1500 | 1 | 0 | 0 |
| | මීටර් 300 බාධක | 1 | 0 | 0 |
| | හෙල්ල විසි කිරීම | 1 | 0 | 0 |
| | මීටර් 1500 | 1 | 0 | 0 |
| | මීටර් 400 | 0 | 1 | 0 |
| | දුර පැනීම | 0 | 0 | 1 |
| 5 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙල - සැමෝවා | බර ඉසිලීම | 0 | 2 | 1 |
| | උස පැනීම | 0 | 1 | 0 |
| | මීටර් 400 කඩුලු පැනීම | 0 | 1 | 0 |
| | ස්කොෂ් | 0 | 0 | 1 |
| 8 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය කරාතේ තරඟාවලිය - ඉන්දියාව, නවදිල්ලි | කරාතේ | 9 | 13 | 26 |

| | | | | |
|---|---|---|---|---|
| තායිලන්ත කණිෂ්ට මලල ක්‍රීඩා තරඟාවලිය | මීටර් 100 (පිරිමි) | 1 | 0 | 0 |
| | දුර පැනීම | 1 | 0 | 0 |
| | මීටර් 400 | 1 | 0 | 0 |
| | තුන් පිම්ම | 1 | 0 | 0 |
| | කඩුලු පැනීම | 1 | 1 | 0 |
| | 4×100 සහය දිවීම | 0 | 1 | 0 |
| | මීටර් 100 (ගැහැණු) | 0 | 0 | 1 |
| | මීටර් 200 | 0 | 0 | 1 |
| | මීටර් 400 (පිරිමි) | 0 | 0 | 1 |
| 25 වෙනි ජාත්‍යන්තර විවෘත කරාතේ තරඟාවලිය-ඉන්දියාව, තන්නූර් නඟරය | කරාතේ | 13 | 7 | 2 |
| ආසියානු ශූරතා පාසල් මලල ක්‍රීඩා තරඟාවලිය - චීනය, චුවාන් | මීටර් 400 (පිරිමි) | 1 | 0 | 0 |
| | මීටර් 300 කඩුලු (පිරිමි) | 1 | 0 | 0 |
| | තුන්පිම්ම (පිරිමි) | 1 | 0 | 0 |
| | උස පැනීම (ගැහැණු) | 1 | 0 | 0 |
| | මීටර් 300 කඩුලු පැනීම (ගැහැණු) | 1 | 0 | 0 |
| පොදු රාජ්‍ය මණ්ඩලිය බර ඉසිලිමේ ශූරතාවලිය - මැලේසියාව | බර ඉසිලිම | 1 | 1 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලිය ක්‍රිඩා උළෙල- ග්ලාස්ගෝ | බර ඉසිලිම | 0 | 1 | 0 |
| මලයාසියානු විවෘත මලල ක්‍රිඩා ශූරතාවලිය | මලල ක්‍රිඩා | 3 | 0 | 0 |
| **එකතුව** | | **45** | **38** | **42** |

## ජාතික මහා ක්‍රීඩා උළෙල

මෙවර පැවැත්වූ 41වන ජාතික මහා ක්‍රීඩා උළෙල දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී අති උත්සවාකාරයෙන් පැවැත්විණි. මෙහිදී දක්ෂතතම ක්‍රීඩකයා වූයේ උස පැනීමේ ඉසව්වේ මීටර් 2.19ක දක්ෂතාවයක් සමඟින් දකුණු පළාත නියෝජනය කළ ඩබ්ලිව්.පී. මංජුල කුමාරයි. දක්ෂතම ක්‍රීඩිකාව වූයේ මීටර් 6.43ක දක්ෂතාවයක් සමඟින් දුර පැනීම ඉසව්වේ නව ශ්‍රී ලංකා වාර්ථාවක් තබමින් බස්නාහිර පළාත නියෝජනය කල එන්.සී.ඩී. ප්‍රියදර්ශණියි.

**41 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේදී පිහිටුවන ලද නව තරඟ වාර්තා**

| ක්‍රීඩාව | ඉසව්ව | ක්‍රීඩකයාගේ නම | පළාත | දක්ෂතාවය |
|---|---|---|---|---|
| පිහිණුම් (පිරිමි) | මීටර් 200 නිදහස් ආර | කේ.පී.එස්.පී ද සිල්වා | මධ්‍යම | වි.1.59:91 |
| | මීටර් 200 බටර්ෆලයි ස්ට්‍රොක් | කේ.පී.එස්.පී ද සිල්වා | මධ්‍යම | වි.2.12:11 |
| | මීටර් 1500 නිදහස් ආර | අයි.එම්. අබේරත්න | මධ්‍යම | වි.18.13:64 |
| පිහිණුම් (ගැහැණු) | මීටර් 800 නිදහස් ආර | අයි.ජ සේනානායක | බස්නාහිර | වි.10.10:56 |


| | | | | |
|---|---|---|---|---|
| | මීටර් 400 නිදහස් ආර | ජේ.සිල්වා | මධ්‍යම | වි.4.59:84 |
| ජවන හා පිටිය | මීටර් 5000 (පිරිමි) | යු.කේ.එන්. රත්නායක | සබරගමුව | වි.16:50.67 |
| | තුන් පිම්ම (ගැහැණු) | එච්.ඩී.වී. ලක්ෂානි | බස්නාහිර | මීටර් 12.98 |
| | යගුලිය විසි කිරීම (පිරිමි) | ආර්.එම්.එස්.ජේ. රණසිංහ | සබරගමුව | මීටර් 75.91 |
| | මීටර් 800 (ගැහැණු) | ඩබ්.කේ.එල්. නිමාලි | දකුණ | වි.2:05.32 |
| | මිටිය විසි කිරීම (ගැහැණු) | පී.කේ.ඒ.ඒ. මධුවන්ති | ඌව | මීටර් 43.18 |
| | දුර පැනීම (ගැහැණු) | එන්.සී.ඩී. ප්‍රියදර්ශනී | බස්නාහිර | මීටර් 6.43 |
| | මීටර් 400 කඩුළු (ගැහැණු) | ඩබ්.පී.ඊ.ආර්. දුලක්ෂි | දකුණ | මීටර් 59.51 |
| | මීටර් 200 (පිරිමි) | එම්.වී. සුරන්ජය | දකුණ | මීටර් 21.02 |
| | යගුලිය විසි කිරීම (ගැහැණු) | බී.එල්.එන්.ලක්මාලි | දකුණ | මීටර් 58.52 |
| | මීටර් 400 (පිරිමි) | එම්.වී. සුරන්ජය | දකුණ | මීටර් 10.45 |
| | 4×400 මීටර් සහය දිවීම (ගැහැණු) | පී.පී.එන්. මධුෂිකා<br>පී.ටී.ඒ අබේරත්න<br>ඩබ්.පී.ඊ.ආර් දුලක්ෂි<br>ඩබ්.කේ.එල්.ඒ. නිමාලි | දකුණ | වි.3:43.98 |

මේ ආකාරයට ජාතික ක්‍රීඩා උළෙලේදී එක් එක් පළාත දිනාගනු ලැබූ පදක්කම් ප්‍රමාණය පළාත තුළ ව්‍යාප්ත වූ ආකාරය පහත සටහන පරිදි වේ.

| පළාත | පදක්කම් | | | |
|---|---|---|---|---|
| | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| බස්නාහිර | 77 | 66 | 53 | 196 |
| මධ්‍යම | 47 | 33 | 57 | 137 |
| වයඹ | 26 | 27 | 34 | 87 |
| දකුණ | 21 | 23 | 36 | 80 |

| | | | | |
|---|---|---|---|---|
| උතුරු මැද | 16 | 20 | 37 | 73 |
| සබරගමුව | 12 | 24 | 31 | 67 |
| ඌව | 6 | 6 | 13 | 25 |
| නැගෙනහිර | 5 | 5 | 9 | 19 |
| උතුර | 1 | 2 | 6 | 9 |
| **එකතුව** | | | | **693** |

**ක්‍රීඩා අමාත්‍යාංශය**


ගරු අමාත්‍යතුමා
ගරු නි. අමාත්‍යතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
අතිරේක ලේකම් (සංවර්ධන)
ප්‍රධාන ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ගණකාධිකාරී (ගෙවීම්)
සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොර. හා සන්නිවේදන තාක්. නිලධාරී
සංවර්ධන නිලධාරී
ප්‍රවෘත්ති නිලධාරී
සැලසුම් සහකාර.
තාක්ෂණ නිලධාරී
රාජ්‍ය කළමණාකරණ සහකාර
නිශ්චල ඡායාරූප ශිල්පී හා කැමරා ක්‍රියාකරු
පිළිගැනීමේ නිලධාරී
රියදුරු
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කාර්යාල සේවක සේවය
කැමරා සහයක

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**දැක්ම**

ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම.

**මෙහෙවර**

ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශක්‍යතා, දක්ෂතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම සහ පර්යේෂණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

**අරමුණු**

1. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.

2. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාල වන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3. ක්‍රීඩා අධ්‍යාපනයේ සංවර්ධන ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය විශේෂඥතාව කාලීනව විධිමත් කිරීම හා මෙහෙයවීම.

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය 1996 වර්ෂයේදී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ලෙස ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය 2005 වර්ෂය දක්වා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානයේදී ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි. දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලි දිවිපෙවතක් උරුම කර දීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්යයන් සහ ඉලක්කගත කණ්ඩායම්**

| | සේවාවන් | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|
| 01 | ක්‍රීඩා පාඨමාලාවන් හා ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම. | ක්‍රීඩකයන්, ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන්, ශාරීරික අභ්‍යාස උපදේශකවරුවන් |
| 02 | ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම. | ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවයන් |
| 03 | ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම. | ක්‍රීඩා ක්ෂේත්‍රයේට සම්බන්ධ සියළුම ආයතන |
| 04 | ශරීරි සුවතා වැඩසටහන් පැවැත්වීම | ශරීර සුවතා පහසුකම් ලබාගැනීමට බලාපොරොත්තුවන මහජනතාව, රාජ්‍ය නිලධාරීන් |
| 05 | ක්‍රීඩා නිලධාරීන්ගේ සේවයේ උසස්වීම් සඳහා අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම | ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් |
| 06 | ක්‍රීඩා පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම | සියළුම ජාතික ක්‍රීඩා සංගම් |

**1 - ක්‍රීඩා පාඨමාලාවන් හා ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම.**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩකයන්, ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් ආරක්ෂක අංශවල නිලධාරීන් හා ස්වේච්ඡා ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා හා වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි.

**2015 වර්ෂය තුළ පැවැත්වූ පාඨමාලා සහ වැඩසටහන් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.**

| | පාඨමාලාව/වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2014/2015<br>ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව -2015/2016 | දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයන්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල්හි ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශවල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් | 76 - 2014/2015<br>57 - 2015/2016 |
| 2 | ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (අධියර පාඨමාලා)<br>මලල ක්‍රීඩා<br>වුෂු<br>බොක්සිං | ක්‍රීඩා පුහුණුකරුවන් | 17 - මලල ක්‍රීඩා<br>26 - වුෂු<br>46 - බොක්සිං<br>34 - බර ඉසිලීම<br>44 - මලල ක්‍රීඩා |

| | | | |
|---|---|---|---|
| | බර ඉසිලීම<br>මලල ක්‍රීඩා - පැනීම් | | (පැනීම්) |
| 3 | ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා නාවික හමුදාවේ ක්‍රීඩා පුහුණු උපදේශකවරුන් | 34 |
| **ක්‍රීඩා නවීකරණ ව්‍යාපෘතිය යටතේ පැවැත්වූ පාඨමාලා සහ වැඩසටහන්** | | | |
| 4 | පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව දැල්පන්දු | දැල්පන්දු පුහුණුකරුවන් | 62 |
| 5 | ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන - මලල ක්‍රීඩා | මලල ක්‍රීඩා පුහුණුකරුවන් | 200 |
| 6 | පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - රගර් | රගර් පුහුණුකරුවන් | 30 |
| 7 | ශාරීරික යෝග්‍යතා උපදේශක පුහුණු පාඨමාලාව - තෙවන කණ්ඩායම | ශාරීරික සුවතා උපදේශකයින්<br>ශාරීරික අභ්‍යාස ගුරුවරුන්<br>ශරීර සුවතාව පිළිබඳ උනන්දුවක් දක්වන මහජනතාව | 50 |
| 8 | තරුණ සේවා නිලධාරීන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු හා සංවර්ධන වැඩසටහන | තරුණ සේවා සභාවේ ක්‍රීඩා පුහුණු නිලධාරීන් | 40 |
| 9 | පළාත් ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු වැඩසටහන (ඌව, බස්නාහිර, මධ්‍යම, සබරගමුව, උතුර, නැගෙනහිර, වයඹ) | පළාත් ක්‍රීඩා නිලධාරීන් සහ පුහුණුකරුවන් | ඌව - 42<br>බස්නාහිර - 24<br>මධ්‍යම - 41<br>සබරගමුව - 51<br>උතුර - 63<br>නැගෙනහිර- 52<br>වයඹ - 51 |
| 10 | පාසල් දරුවන්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන (දික්වැල්ල මධ්‍ය විද්‍යාලය සහ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලය) | පාසල් දරුවන් | 200<br>(එක් පාසලකින් 100 දෙනෙකු බැගින්) |
| 11 | පාසල් ගුරුවරුන් සඳහා ක්‍රීඩා පුහුණු වැඩසටහන | පාසල් ප්‍රාථමික ගුරුවරුන් | 78 |
| 12 | දෛනිකව පැවැත්වෙන ශාරීරික ව්‍යායාම වැඩසටහන | මහජනතාව | 209 |
| 13 | පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව කරාතේ | කරාතේ පුහුණුකරුවන් | 100 |
| 14 | ක්‍රීඩා නිලධාරීන්ගේ සහ ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ | ක්‍රීඩා නිලධාරීන් සහ ක්‍රීඩා පුහුණුකරුවන් | 12 |





**සහතික පත්‍ර ප්‍රදානෝත්සවය - 2015**

**1.1. ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව**

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව වාර්ෂිකව පවත්වනු ලබන ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රධානතම අධ්‍යයන පාඨමාලාවයි. දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයන්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල්හි ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශවල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ අභ්‍යාසලාභින් ලෙස තම අධ්‍යයන කටයුතු සිදුකරනු ලබයි.

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීමේ අරමුණු

- ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියතු ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන් ශාරීරික අභ්‍යාස උපදේශකයන් සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව සලසා දීම.
- ක්‍රීඩා ක්ෂේත්‍රයේ රැකියාවක් ලබාගැනීමට බලාපොරොත්තුවෙන් සිටින දක්ෂතා සපිරි ක්‍රීඩකයන් සඳහා අවශ්‍ය පදනමක් සලසා දීම.
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම ක්‍රීඩාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පුහුණුකරුවන් බිහිකිරීම.

2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා අභ්‍යාසලාභින් 57ක් අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටී.

**1.2. ක්‍රීඩා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

ක්‍රීඩා පුහුණුකරුවන් සවිබල ගැන්වීම සහ නවීන පුහුණු කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ දැනුම පුහුණුකරුවන්ට ලබා දීමේ අරමුණින් මෙම පාඨමාලාව පවත්වනු ලබයි. මෙම වසරේදී ක්‍රීඩා හතකට අදාලව (මලල - ක්‍රීඩා පැනීම්, කෙටිදුර ධාවන, බොක්සිං, බර ඉසිලීම, පැසිපන්දු, බැඩ්මින්ටන්, පාපන්දු සහ වුෂු) පාඨමාලා පැවැත්වූ අතර 2016 දකුණු ආසියානු තරඟ ක්‍රීඩකයින් පුහුණු කිරීමට අවශ්‍ය නව දැනුම හා තාක්ෂණික ක්‍රම පුහුණුකරුවන් වෙත ලබාදීම මෙහිදී සිදුවිය.



**පාඨමාලාවේ සමාරම්භක අවස්ථාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි**

### 1.3. ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු පාඨමාලාව

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්ගේ ක්‍රීඩා පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වූ අතර ඒ සඳහා නිලධාරීන් 34 දෙනෙකු සහභාගී විය.

### 1.4. පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - දැල්පන්දු

ශ්‍රී ලංකාවේ දැල් පන්දු පුහුණුකරුවන්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම පාඨමාලාව පැවැත්වූ අතර ඒ සඳහා දැල්පන්දු පුහුණුකරුවන් 62 ක් සහභාගී විය.




**පාඨමාලාවට අදාල ප්‍රායෝගික පුහුණුවීම් සිදුකරමින්**

### 1.5. ක්‍රීඩා දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළුව - මලල ක්‍රීඩා

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ මලල ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස ලියාපදිංචි වූ පුහුණුකරුවන්ගේ දැනුම ඉහල නැංවීමට වැඩමුළුව පවත්වන ලදි. පුහුණුකරුවන් 200 දෙනෙකු සහභාගී වූ මෙම වැඩමුළුවේ සම්පත්දායකයින් ලෙස ප්‍රධාන වශයෙන් කටයුතු කරන ලද්දේ ඉන්දියාවේ ශාරීරික අධ්‍යාපන උපාධි ආයතනයේ ආචාර්යවරුන් දෙදෙනෙකි.



**වැඩමුළුව සඳහා සහභාගිවූ පුහුණුකරුවන්ට, ඉනාවේ ශාරීරික අධ්‍යාපන උපාධි ආයතනයේ ආචාර්යවරුන් විසින් සහතික පත්‍ර ප්‍රදානය කිරීම**

**1.6. පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - රගර්**

වර්තමානයේ ශ්‍රී ලංකාව තුල ඉහල වර්ධනයක් පෙන්නුම් කරන ක්‍රීඩාවක් ලෙස රගර් ක්‍රීඩාව හඳුනාගෙන ඇති අතර රගර් ක්‍රීඩාව තවදුරටත් සවිබල ගැන්වීමට ඊට අදාල පුහුණුකරුවන්ගේද දැනුම, කුසලතා සහ හැකියාවන් වර්ධනය කල යුතුය. එය අරමුණු කර ගනිමින් රගර් පුහුණුකරුවන් සඳහා පැවැත්වූ පුහුණු පාඨමාලාව සඳහා පුහුණුකරුවන් 30 දෙනෙකු සහභාගි විය. පාඨමාලාව මාස 03ක කාලයක් පැවැත්විණි.

**1.7. ශාරීරික යෝග්‍යතා උපදේශන පුහුණු පාඨමාලාව**

ශරීර සුවතාවය ඉහල මට්ටමින් පවත්වාගෙන යාමට ශ්‍රී ලාංකික ප්‍රජාව වර්තමානයේ බෙහෙවින් උත්සහ දරන අතර ඊට අවශ්‍ය වන නව දැනුම සහ ක්‍රමවේදයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා දීම මෙම පාඨමාලාව පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ. පාඨමාලාව සඳහා ශරීර සුවතා උපදේශකයින්, ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, නීරෝගී දිවිපෙවතක් කෙරෙහි උනන්දු වන අනෙකුත් පාර්ශවයන් සහභාගි වන අතර මේ වන විට කණ්ඩායම් 3 ක් සඳහා පාඨමාලාව පවත්වා ඇත. මෙම වර්ෂයේදී පාඨමාලාව සඳහා සහභාගි වූ පිරිස 72කි.

**1.8. තරුණ සේවා නිලධාරීන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු හා සංවර්ධන වැඩසටහන**

තරුණ සේවා සභාවේ ක්‍රීඩා පුහුණු නිලධාරීන් සඳහා පැවැත්වූ මෙම වැඩසටහන එම නිලධාරීන්ගේ ක්‍රීඩා දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා 40 දෙනෙකු සහභාගි විය.

**1.9. පළාත් ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන**

ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් ක්‍රියාත්මක කළ මෙම ක්‍රීඩා පුහුණු වැඩසටහනෙන් පළාත් ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සිදු කල අතර ඒ තුලින් අදාල පළාත තුල ක්‍රීඩාව වර්ධනය කිරීමට හැකි විය. මෙම පුහුණු වැඩසටහන ඌව, බස්නාහිර, මධ්‍යම, සබරගමුව, උතුර, නැගෙනහිර, වයඹ පළාත්වලදී පවත්වන ලදි. ඒ සඳහා ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් 324 දෙනෙකු සහභාගි විය.



උතුරු පළාත් ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන් සඳහා පැවැත්වූ වැඩසටහන

### 1.10. පාසල් දරුවන්ගේ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීම සඳහා පැවැත්වූ වැඩසටහන්

පාසල් දරුවන්ගේ ක්‍රීඩා කුසලතා ඔප්නැංවීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර තෝරා ගත් පාසලක සිසුන් 100 දෙනෙකු බැගින් ඒ සඳහා යොදවාගනු ලබයි. මෙම වසරේදී දික්වැල්ල මධ්‍ය විද්‍යාලයේ සහ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලයේ දරුදැරියන්ගේ ක්‍රීඩා



පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලයේ දරුදැරියන් සඳහා පැවැත්වූ වැඩසටහන

### 1.11. පාසල්හි ප්‍රාථමික අංශයේ ගුරුවරුන් සඳහා පැවැත්වූ ක්‍රීඩා පුහුණු වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් කලාප අධ්‍යාපන කාර්යාලයන්හි පාසල් ප්‍රාථමික ආංශයේ සම්බන්ධීකරණ නිලධාරීන්ට අවශ්‍ය වන ක්‍රීඩා දැනුම ඉහල නැංවීම සඳහා පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කල අතර 78 දෙනෙකු ඒ සඳහා සහභාගී විය.

### 1.12. දෛනිකව පැවැත්වෙන ශාරීරික ව්‍යායාම වැඩසටහන

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් ස්ථාපිත කර ඇති ශරීර සුවතා උපදේශන ඒකකය යටතේ දෛනිකව ශාරීරික ව්‍යායාම වැඩසටහන පැවැත්වේ. ශරීර සුවතාව පවත්වා ගැනීම පිළිබඳ උපදේශනය, ශරීර සුවතාවට අදාල පරීක්ෂණ පැවැත්වීම, මෙම වැඩසටහනට සමගාමීව සිදුවන කාර්යයන් වේ.

මෙම වර්ෂයේ ශරීර සුවතා වැඩසටහනට ශරීර සුවතාව පිළිබඳව උනන්දුවක් දක්වන 209 ක පමණ පිරිසක් ලියාපදිංචි වී ඇත.

**1.13. පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - කරාතේ**

ශ්‍රී ලංකාවේ කරාතේ පුහුණුකරුවන්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම පාඨමාලාව පැවැත්වූ අතර ඒ සඳහා කරාතේ පුහුණුකරුවන් 100 ක් සහභාගි විය.

**02. ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම**

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා තොරතුරු සැපයීමේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා පුස්තකාලය හඳුන්වා දිමට හැකිය. මෙම පුස්තකාලය මගින් e – book සේවාව, ක්‍රීඩාවට අදාල සංයුක්ත තැටි පිටපත් ලබාදීමේ සේවාව, පුවත් පත් හා ප්‍රස්ථ බැහැර දීමේ සේවාව, ක්‍රීඩා සම්පත්දායක තොරතුරු ලබා දීමේ සේවාව, e- Library Friend සේවාව සහ e-News Paper සේවාවන් ලබා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට ඉමහත් සේවයක් ඉටු කරන මෙම පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කරමින් පවතින අතර ඒ සඳහා ඓතිහාසික වැදගත්කමකින් යුතු ක්‍රීඩා ප්‍රලේඛන ඩිජිටල්ගත කිරීම සහ ග්‍රන්ථ බැහැරදීමේ සේවාව වඩා කාර්යක්ෂමව මෙන්ම විධිමත්ව ඉටු කිරීමට පුස්තකාලය සතු සියලුම ග්‍රන්ථ බාර්කෝඩ්ගත කිරීමටත් අපේක්ෂා කෙරේ.

**03. ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම**

ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ ආයතන සහ ක්‍රීඩා සංගම් විසින් පවත්වනු ලබන වැඩමුළු, දේශන සහ පරික්ෂණ කටයුතු සඳහා අවශ්‍ය දේශන ශාලා, විභාගශාලා, ගෘහස්ථ ක්‍රීඩාගාර සහ ශ්‍රවණාගාර සහසුකම් සැපයීම ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් ඉටු කරනු ලබයි. ඒ තුලින් සමස්ථ ක්‍රීඩාව සංවර්ධනයට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ඉහල දායකත්වයක් සපයයි.

**04. ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් ස්ථාපිත කර ඇති ශරීර සුවතා උපදේශන ඒකකය මහජනතාවගේ ශරීර සුවතාව මනාව පවත්වා ගැනීමට අවශ්‍ය සහය ලබාදෙයි. එනම් ශරීර සුවතාව පවත්වා ගැනීම පිළිබඳ න්‍යායාත්මක දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පරික්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

තවද විවිධ රාජ්‍ය ආයතන මගින් කරනු ලබන ඉල්ලීම් මත ශරීර සුවතා වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ආයතන පරිශ්‍රයේ දෛනිකව ද ව්‍යායාම වැඩසටහනක් මහජනතාව උදෙසා පවත්වනු ලබයි. මේ වන විට දෛනිකව ව්‍යායාම වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති සාමාජිකයින් ගණන 209කි.

**05. ක්‍රීඩා සේවයේ නිලධාරින්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය කඩඉම් පරික්ෂණ පැවැත්වීම**

ක්‍රීඩා සේවයේ ක්‍රීඩා නිලධාරින්ගේ සහ ක්‍රීඩා පුහුණුකරුවන්ගේ උසස්වීම් සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ පැවැත්වීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටුකරනු ලබයි. මෙම වසරේදී ද ක්‍රීඩා නිලධාරින් හා ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා එම පරික්ෂණ කටයුතු සාර්ථකව පවත්වන ලදි.

**06. ක්‍රීඩා පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකාවේ සියළුම ක්‍රීඩා ක්ෂේත්‍රයන්ට අදාල ක්‍රීඩා පුහුණුකරුවන් හඳුනා ගනිමින් ඔවුන් ලියාපදිංචි කිරීමේ සහ දැනුම, කුසලතාවයන් වර්ධනය කිරීමේ ප්‍රමුඛ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ඉටු කරනු ලබයි. මෙහිදි ප්‍රවීණ පුහුණුකරුවන් මෙන්ම ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණුකරු කුසලතා සංවර්ධන වැඩසටහන යටතේ සුදුසුකම් ලබන පුහුණුකරුවන් ද ලියාපදිංචි කර ලියාපදිංචි සහතිකයක් ලබා දිමට කටයුතු කරයි. මේ වන විට ක්‍රීඩා අටක් සඳහා එනම් මලල ක්‍රීඩා, පා පන්දු, වොලිබෝල්, පිහිනුම්, බැඩ්මින්ටන්, ජූඩෝ, දැල් පන්දු සහ රගර් යන ක්‍රීඩා සඳහා මෙම වැඩසටහන සාර්ථකව ඉටු කර ඇත.

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 2015 වර්ෂයේදි ලබා ඇති භෞතික සම්පත්, මානව සම්පත් සහ මූල්‍ය සම්පත්වල ප්‍රගතිය**



**නව ක්‍රීඩා අමාත්‍යතුමා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රගතිය පිළිබඳ විමසමින්**

**භෞතික සම්පත්**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නව ශරීර සුවතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ව්‍යායාම් උපකරණ මෙම වසරේදි මිලදි ගන්නා ලදි. මෙම ව්‍යායාම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම මඟින් ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවලට අදාල ප්‍රායෝගික ව්‍යායාම්/ක්‍රියාකාරකම් පැවැත්වීමට අපේක්ෂිතය. තවද, පාඨමාලාවල අධ්‍යයන කටයුතු සදහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ, කාර්යාල කටයුතු සදහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ මෙම වර්ෂයේදි මිලදිගන්නා ලදි.

**මානව සම්පත්**

ආයතනික කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාවන් සහ කුසලතාවයන් වර්ධනය කිරීම තුලින් සමස්ථ ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ක්‍රියා කරයි. ඒ අනුව මෙම වසරේදි ආයතනික කාර්යමණ්ඩලය සහභාගිවූ වැඩසටහන් හා පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| පාඨමාලාව | කාලය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පුස්තකාල පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ වැඩමුළුව | දින 01 | 01 |
| ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන වැඩමුළුව (චීනයේ) | දින 20 | 03 |
| ඩිජිටෙල් පුස්ථකාල සහ දැනුම කළමනාකරණ පාඨමාලාව(ඉන්දියාවේ) | මාස 02 | 01 |

**මූල්‍ය සම්පත්**


2015 වර්ෂයේදී ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය රජයේ ඒකාබද්ධ අරමුදලට සපයා ඇති මූල්‍ය දායකත්වය පහත පරිදි වේ.

| | විෂය | 2015 වර්ෂය (රු.මි) |
|---|---|---|
| 1 | පාඨමාලා ගාස්තු | 0.71 |
| 2 | පුහුණුකරු කුසලතා සංවර්ධන වැඩසටහන | 1.10 |
| 3 | දේශනශාලා වෙන්කිරීම් | 0.67 |
| 4 | ශාරීරික යෝග්‍යතා උපදේශණ වැඩසටහනේ සමාජික ගාස්තු | 0.47 |
| 5 | නේවාසික පහසුකම් | 0.34 |
| | **එකතුව** | **3.29** |

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අනුමත තනතුරු පිළිබඳ තොරතුරු 2015**

| තනතුරු | නිලධර ශ්‍රේණිය | වැටුප් තත්ත්වය | තනතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | පවතින | පුරප්පාඩු |
| අධ්‍යක්ෂ | මාණ්ඩලික | එස්.එල්. 1 | 01 | 01 | - |
| ලේඛකාධිකාරී | තෘතික | එම්.එන්. 7 | 01 | 01 | - |
| රාජ්‍ය භාෂා පරිවර්තක | තෘතික | එම්.එන්. 6 | 01 | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරී | තෘතික | එම්.එන්. 6 | 01 | 01 | - |
| සහකාර කථිකාචාර්ය | ද්විතිය | එම්.එන්. 4 | 05 | 04 | 01 |
| මානව සම්පත් නිලධාරී | ද්විතිය | එම්.එන්. 4 | 01 | 01 | - |
| පුස්තකාල හා විඥාපන නිලධාරී | ද්විතිය | එම්.එන්. 4 | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරී | ද්විතිය | එම්.එන්. 4 | 06 | 06 | - |
| පුස්තකාලයාධිපති | ද්විතිය | එම්.එන්. 3 | 01 | 01 | - |
| ක්‍රීඩා පුහුණුකරු | ද්විතිය | එම්.එන්. 3 | 01 | 0 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතිය | එම්.එන්. 2 | 02 | 01 | 01 |
| නේවාසිකාගාර පාලිකා | ද්විතිය | එම්.එන්. 1 | 01 | 01 | - |
| රියදුරු | ප්‍රාථමික | පී.එල්. 3 | 01 | 01 | - |
| කාර්යාල කාර්ය සහයක | ප්‍රාථමික | පී.එල්. 1 | 06 | 05 | 01 |
| | | | **29** | **25** | **04** |

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
සංවිධාන සටහන



# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නිරෝගී බව පවත්වාගෙන යාම සඳහාත් ඔවුන්ගේ රෝග නිවාරනය සඳහාත් පිහිටුවා ඇති එකම ආයතනය ක්‍රීඩා වෛද්‍ය ආයතනයයි.

1991 වර්ෂයේ දී ක්‍රීඩා වෛද්‍ය ඒකකය වශයෙන් පිහිටවූ මෙය 2006 දී ක්‍රීඩා වෛද්‍ය ආයතනය ලෙස නම් කරන ලදි. පාසල් මට්ටමින් පටන් ගෙන ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාමේදී නිරෝගී ක්‍රීඩකයින් හා ක්‍රීඩිකාවන් ලොවට දායද කිරීමට මෙම ආයතනය කැපවී සිටී.

ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ

**දැක්ම**

ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ කේන්ද්‍රස්ථානය වෙමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය දියුණු කිරීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දෙමින් ඔවුන්ගේ දක්ෂතා ජාත්‍යන්තර තලයට ගෙන ඒම

**අරමුණු :-**

1. සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍යය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ආසියාව තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.
2. නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හදුනා ගැනීම
3. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔවුන් විසින්ම උරුම කර ගනු ලැබූ හැකියාවන් ආරක්ෂා කර දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

4. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම තුළින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිලියම් යෙදීම
5. ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.
6. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව මැන බැලීම සහ කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම
7. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පෝෂණ උපදෙස් ලබාදීම හා පෝෂණ තත්වය මැන බැලීම.
8. ක්‍රීඩාවෙන් ජයග්‍රහණ ලබා ගැනීම සදහා සෞඛ්‍ය තත්වය හොඳින් පවත්වා ගැනීමේ වටිනාකම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම.
9. ලංකාවේ සිටින සියළුම ක්‍රීඩක, ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, දෙමාපියන් හා ක්‍රීඩාව හා සම්බන්ධ සියළුම නිලධාරීන් ක්‍රීඩා අනතුරු වලින් ආරක්ෂා වීම, පෝෂණයේ වැදගත්කම, මානසික සෞඛ්‍ය හා තහනම් උත්තේජක යනාදි කරුණු ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම.
10. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සදහා අවශ්‍ය කරන සේවය ඉතා උසස් මට්ටමකින් ලබා දීමේ අරමුණ ඇතිව පළාත් හා දිස්ත්‍රික් රෝහල් වල ක්‍රීඩා වෛද්‍ය ඒකක ස්ථාපිත කිරීම.
11. ක්‍රීඩාවේදි අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් සහ වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සදහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. දේශිය හා විදේශිය වශයෙන් පවත්වනු ලබන තරගාවලි සදහා ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.
13. ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සදහා අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගැනීම.
14. ක්‍රීඩා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම.

**සේවාවන්**

ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ආයතනික අරමුණු ඉටුකර ගැනිම සදහා පහත අංශ ඔස්සේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සේවය සපයනු ලැබේ.

1. සායනික සේවාවන්
    - හදිසි ප්‍රතිකාර සේවා
    - ඖෂධ ලබාදීම
    - කායික චිකිත්සාව - භෞත චිකිත්සාව, සම්භාහක චිකිත්සාව, කටු චිකිත්සාව
2. ක්‍රීඩා විද්‍යාව
    - පෝෂණය
    - චලන විද්‍යව (Movement Science)
    - කායික විද්‍යාව
    - කායික යෝග්‍යතාව
    - රුධිර සංසරණ හා ශ්වසන පද්ධතිය සම්බන්ධ යෝග්‍යතා පරීක්ෂණ ($VO_2$ Max පරීක්ෂණ)
    - වෛද්‍ය ඇගයීම්
    - පර්යේෂණ

3. සෞඛ්‍ය අධ්‍යාපනය

ක්‍රීඩක ක්‍රීඩිකාවන් / පුහුණුකරුවන් දැනුවත් කිරීම

දෙමාපියන් දැනුවත් කිරීම

සහයක භෞත චිකිත්සක හා සම්භාහක සහතිකපත්‍ර පාඨමාලාව සමත්වීම

ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

**ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලියාපදිංචි කිරීම**

ක්‍රීඩා වෛද්‍ය ආයතනයට සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලියාපදිංචි විය යුතුය. ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට අවශ්‍ය ප්‍රතිකාර හා අනෙකුත් සේවාවන් සඳහා ක්‍රීඩා දින පොතක් නිකුත් කර ඇති අතර ඔවුන් එම ක්‍රීඩා දිනපොත රැගෙන ඒම අනිවාර්ය වේ. ජාතික සංචිත නොවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමන් හට හිමි අංකය යටතේ ඇති සායනික ඉතිහාසය සහිත පත්‍රය ලේඛනාගාරයෙන් ලබාගත යුතුය.

**2015 ලියාපදිංචි කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් - ( ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | නව ලියාපදිංචි කිරීම | පැරණි ලියාපදිංචි කිරීම් | | මුළු ගණන |
|---|---|---|---|---|
| | | ජාතික සංචිත | ජාතික සංචිත නොවන | |
| ජනවාරි | 132 | 84 | 301 | **517** |
| පෙබරවාරි | 168 | 119 | 258 | **545** |
| මාර්තු | 168 | 106 | 385 | **659** |
| අප්‍රියෙල් | 182 | 130 | 324 | **636** |
| මැයි | 190 | 103 | 298 | **591** |
| ජුනි | 276 | 147 | 337 | **760** |
| ජුලි | 207 | 99 | 383 | **689** |
| අගෝස්තු | 181 | 208 | 333 | **722** |
| සැප්තැම්බර් | 105 | 144 | 205 | **454** |
| ඔක්තෝම්බර් | 187 | 202 | 289 | **678** |
| නොවැම්බර් | 175 | 350 | 255 | **780** |
| දෙසැම්බර් | 166 | 172 | 110 | **448** |

## හදිසි ප්‍රතිකාර සහ සායනික අංශයේ සේවාවන්

හදිසි ප්‍රතිකාර හා සායනික අංශය මගින් ජාතික මට්ටමේ සිට පාසල් ක්‍රීඩක, ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් ක්‍රීඩාව හා සබැඳි ආයතන සංගම්, ක්‍රීඩා අමාත්‍යංශ සියළු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය හදිසි ප්‍රතිකාර සහ සායනික සේවාවන් ලබාදිම කරනු ලබයි.

හදිසි ප්‍රතිකාර ඒකකය, රෝගින් ඇඳන් දෙකකින් සමන්විත වන අතර නිහාරි කරණය (Nebulization) , ඖෂධ හා ඔක්සිජන් ආනනකරණය, විද්‍යුත් බන්තුක රේඛණ ගැනිම, ඖෂධ ප්‍රදනය, ඖෂධ එන්නත් කිරිම, අන්තඃශෛරීක ආවිලයිත ලබාදිම, වන්ද්‍යකෘත සැරහුම් හා මැහුම් දැම්ම, සෞඛ්‍යය අධ්‍යාපනය හා උපදේශනය සිදු කරයි.

මිට අමතරව ජාතික මහා ක්‍රීඩා උලෙළ සහ අනෙකුත් සංගම් මගින් පවත්වන විවිධ ක්‍රීඩා ඉසව්, ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් සඳහා ප්‍රතිකාර හා ප්‍රථමාධාර ලබාදිමටද විවිධ ක්‍රීඩා ඉසව් සහ සංචිත සඳහා වෛද්‍ය පරීක්ෂණ සංවිධානය කිරිමද, දේශන ලබාදිමද සිදුකරයි.
ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ වෛද්‍යවරුන් විසින් පරික්ෂා කර බලා යොමු කරන රෝගින් පිටත සායනවලට යැවිම හා වැඩිදුර ප්‍රතිකාර සඳහා ජාතික රෝහල වෙත යොමු කරනු ලබයි

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හදිසි ප්‍රතිකාර | 15 | 12 | 12 | 12 | 12 | 17 | 15 | 14 | 18 | 37 | 19 | 17 | **200** |
| සාමාන්‍ය ප්‍රතිකාර | 16 | 13 | 37 | 08 | 14 | 19 | 49 | 18 | 27 | 32 | 47 | 26 | **306** |
| සැරහුම් යෙදිම | 26 | 27 | 28 | 24 | 19 | 34 | 27 | 37 | 43 | 38 | 23 | 21 | **347** |
| මැහුම් දැම්ම හා ඉවත් කිරිම | 01 | 02 | 01 | | 01 | 01 | 01 | 02 | 02 | 02 | 01 | 01 | **15** |
| ඖෂධ ප්‍රදානය | 28 | 76 | 118 | 52 | 56 | 88 | 83 | 113 | 158 | 243 | 226 | 78 | **1319** |
| නිහාරිකරණය | 01 | | 02 | | | 02 | | 01 | 01 | 01 | 02 | 01 | **11** |
| නික්ෂේපණ | 02 | 02 | 08 | 02 | 03 | 15 | 12 | 13 | 03 | 21 | 24 | 03 | **108** |
| වෛද්‍ය පරික්ෂණ | - | 20 | 120 | 54 | | 06 | 12 | 04 | | 04 | | | **220** |
| රෝගින් මාරුකර යැවිම් | 01 | 01 | 02 | 01 | 01 | 01 | | | 01 | 02 | | 01 | **11** |
| **එකතුව** | **90** | **153** | **328** | **153** | **106** | **183** | **199** | **201** | **253** | **380** | **342** | **148** | **2537** |

**භෞත චිකිත්සක අංශය**

ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුළ පිහිටා ඇති භෞත චිකිත්සක අංශය මගින්, ජාතික සංචිතවල සිටින කණිෂ්ඨ ජාතික සංගම්, ක්‍රීඩා සංගම් සහ පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ප්‍රතිකාර සිදු කරනු ලබයි.

දෛනිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10-20 ත් අතර සංඛ්‍යාවක් භෞත චිකිත්සක ප්‍රතිකාර සඳහා මෙම අංශය වෙත යොමු වේ. තවද මෙම අංශයට පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සදහා පහත සදහන් සේවාවන් සැපයේ.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආබාධ තත්ත්වයන් පරීක්ෂා කිරීම.
- රෝගි තත්වයට අදාල ප්‍රතිකාර සිදු කිරීම.
- රෝගි තත්වය සුවපත් කර ගැනීමට අවශ්‍ය ව්‍යායාම හදුන්වාදීම.
- ක්‍රීඩා ඉසවු වලට අදාල වු ශාරීරික යෝග්‍යතාවයන් පවත්වා ගැනීමට අවශ්‍ය ව්‍යායාම හදුන්වාදීම.
- එක් එක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සදහා වෙන් වු දිගු කාලින ශාරීරික පුනරුත්තාපන ව්‍යායාම නිර්මාණය කිරීම සහ හදුන්වා දීම.
- නැවත නැවත ක්‍රීඩක ක්‍රීඩිකාවන් අප අංශයට ගෙන්වා ගෙන ඔවුන්ගේ ශරීරික සෞඛ්‍ය තත්වය යථා තත්ත්වයට පත්වී ඇද්ද හා ක්‍රීඩා කිරීමට තරම් සුදුසු යෝග්‍යතාවයක් ඇද්දැයි පරීක්ෂා කර බැලීම.

භෞත චිකිත්සක අංශය වෙත පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ බහුතරයක් මලල ක්‍රීඩාව සම්බන්ධ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වේ.

| | **ජනවාරි** | **පෙබරවාරි** | **මාර්තු** | **අප්‍රේල්** | **මැයි** | **ජුනි** | **ජුලි** | **අගෝස්තු** |
|---|---|---|---|---|---|---|---|---|
| **මුළු ක්‍රීඩකයන් ගණන** | 153 | 100 | 164 | 134 | 100 | 122 | 91 | 56 |
| **මුළු ක්‍රීඩිකාවන් ගණන** | 61 | 49 | 66 | 54 | 51 | 70 | 60 | 30 |
| **මුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගණන** | 214 | 149 | 230 | 188 | 151 | 192 | 151 | 86 |
| **දිනකට සාමාන්‍යය සැසි ගණන** | 09 | 13 | 22 | 10 | 21 | 23 | 13 | 08 |
| **මුළු සැසි ගණන** | **251** | **277** | **463** | **303** | **414** | **381** | **272** | **122** |

**ක්‍රීඩාව අනුව භෞත චිකිත්සාව සඳහා පැමිණෙන ක්‍රීඩක/ක්‍රීඩිකාවන්**

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝස්තු | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| මලළ ක්‍රීඩා - දිවීම් | 29 | 31 | 29 | 24 | 24 | 30 | 25 | 13 | **205** |
| යගුලිය විසි කිරීම | | | 02 | | | 01 | | | **03** |
| හෙල්ල විසි කිරීම | | 01 | 01 | 01 | 02 | 05 | 04 | 01 | **15** |
| කවපෙත්ත විසි කිරීම | | | 01 | | | 01 | | 01 | **03** |
| දුර පැනීම | | 02 | 04 | 02 | 02 | 06 | 03 | 02 | **21** |
| උස පැනීම | | 01 | | | | 02 | 01 | | **04** |
| තුන් පිම්ම | | 01 | 02 | 03 | 03 | | 02 | 03 | **14** |
| රිටි පැනීම | | | | | | 01 | | | **01** |
| දුනු විදීම | | 01 | | | 01 | 04 | 02 | 03 | **10** |
| බේස්බෝල් | 01 | 02 | 03 | 03 | 01 | 04 | 02 | | **16** |
| බැට්මින්ටන් | 08 | 10 | 13 | 02 | 05 | 05 | | | **43** |
| බාස්කට් බෝල් | 02 | 05 | 09 | 03 | 03 | 07 | 08 | 02 | **39** |
| බොක්සින් | 05 | 01 | 02 | | 02 | 04 | 02 | 02 | **18** |
| වෙරළ වොලිබෝල් | 02 | 01 | 01 | 02 | 02 | | | | **08** |
| කාය වර්ධන | | 01 | | | | | | | **01** |
| ක්‍රිකට් | 21 | 22 | 25 | 14 | 08 | 15 | 18 | 13 | **136** |
| එල්ලේ | | | | | 01 | 01 | 01 | | **03** |
| පාපන්දු | 03 | 08 | 08 | 01 | 02 | 02 | 04 | 04 | **32** |
| ෆෙන්සින් | 02 | 04 | 01 | | 02 | 03 | | | **12** |
| ජිම්නාස්ටික් | | 01 | 02 | 03 | 02 | 01 | 01 | 01 | **11** |
| හොකී | 01 | 02 | 06 | 03 | | 04 | | | **16** |
| හෑන්ඩ් බෝල් | 02 | 02 | 01 | 01 | 03 | 01 | 01 | | **11** |
| ජුඩෝ | | 01 | 01 | 01 | 01 | 03 | 02 | | **09** |
| කරාටේ | | 02 | 21 | 23 | 02 | 07 | 09 | 02 | **66** |
| කබඩි | | | 03 | 01 | 02 | | | 01 | **07** |
| දැල් පන්දු | | 02 | 10 | 13 | 16 | 18 | 09 | 02 | **70** |
| ඔරු පැදීම | 02 | 01 | 01 | 05 | 07 | | 06 | 03 | **25** |
| රගර් | 30 | 31 | 47 | 41 | 44 | 47 | 30 | 20 | **290** |
| වෙඩි තැබීම | | 01 | 02 | 01 | | | | 01 | **05** |
| පිහිනුම් | | 01 | 03 | | 01 | 05 | 04 | 02 | **16** |
| ස්කොට් | | | 02 | | | | | | **02** |
| සොකර් | | 01 | | | | | | | **01** |
| ටයිකොන්ඩෝ | | 01 | 02 | 03 | 01 | | 01 | 01 | **09** |
| මේස පන්දු | 01 | 02 | 03 | 01 | | 01 | 02 | | **10** |
| ටෙනිස් | | 01 | 02 | 03 | | | 01 | | **07** |
| ත්‍රෝ බෝල් | | | | | | 04 | | | **04** |
| වොලි බෝල් | 02 | 02 | 09 | 11 | 08 | | 03 | 04 | **39** |
| බර එසවීම | | | 04 | 05 | 02 | 03 | 01 | 01 | **16** |
| රෙස්ලින් | 02 | 02 | 01 | 07 | 03 | 18 | 01 | | **34** |
| වුෂු | 02 | | 01 | 01 | | | 01 | | **05** |
| **එකතුව** | **115** | **144** | **222** | **178** | **150** | **203** | **144** | **82** | **1238** |

**පෝෂණ අංශය**

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උසස් පෝෂණ මට්ටමක් පවත්වා ගැනිම සදහා පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත

- ජාතික සංචිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වයන් මැන බැලීම.
- එක් එක් ක්‍රීඩකයා හට තමන් නියැලි ක්‍රීඩාව අනුව ලබා ගතයුතු පෝෂක ප්‍රමාණය පිළිබද වාර්තාවක් ලබා දිම හා ඔවුන් සාමුහිකව කැදවා පවත්වා ගතයුතු පෝෂක තත්ත්වයන් පිළිබදව උපදෙස් ලබා දිම.
- ජාතික සංචිත සදහා ඔවුන්ගේ පුහුණු වීම් සහ දෛනික ආහාර රටාව සැලකිල්ලට ගනිමින් පොදු ආහාර සටහනක් නිකුත් කිරීම.
- අවශ්‍යතාවය පරිදි අනෙකුත් ජාතික නොවන සංචිත සදහා ද පෝෂණමය ඇගයීම් සිදු කිරීම.
- විදෙස් තරගවලට සහභාගිවන අවස්ථාවලදි ලබාගතයුතු ආහාර වර්ග ඇතුලත් ආහාර සටහන් ද නිකුත් කෙරේ.
- විවිධ සංචිත සදහා සම්පත් දායකයින් පිටතින් ගෙන්වා පෝෂණය සම්බන්ධ වැඩමුළු සංවිධානය කිරීම.
- පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය නගා සිටුවීම සදහා පාසල් මට්ටමින් දේශණ පැවැත්වීම.
- අවශ්‍යතාවය පරිදි විවිධ ක්‍රීඩා සංචිත සදහා ඔවුන් පුහුණුවීම් සිදුකරණ ස්ථාන වලදි දේශන පැවැත්වීම.

**පෝෂණ ඇගයීම්**

| | |
|---|---|
| පෙබරවාරි | - ජාතික රුවල් ඔරු සංචිතය |
| | වෙඩි තැබීමේ ජාතික සංචිතය |
| අප්‍රේල් | - ජාතික දැල් පන්දු සංචිතය |
| ජුලි | - ජාතික බොක්සිං සංචිතය |

**දේශන වැඩමුළු හා පෝෂණ අධ්‍යාපනය**

| | |
|---|---|
| ජනවාරි | - වයඹ සරසවි සිසුන් සඳහා |
| පෙබරවාරි | - ශ්‍රී ජයවර්ධනපුර සරසවි සිසුන් සඳහා |
| මාර්තු | - ජාතික බොක්සිං සංචිතයේ සිසුන් සඳහා |
| අප්‍රේල් | - රාජකීය විද්‍යාලයේ ඔරු පැදිමේ කණ්ඩායම් සිසුන් සඳහා |
| මැයි | - ක්‍රිඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියතු ක්‍රීඩා නිළධාරීන් සඳහා |
| ජුනි | - යුද්ධ හමුදා නෙට් බෝල් කණ්ඩායම සඳහා |

| | |
|---|---|
| | බැට්මින්ටන් ක්‍රීඩකයන් සඳහා |
| ජුලි | - ශ්‍රී ලංකා පෝෂණ සංගමය හා එක්ව පැවැත් වූ පෝෂණ වැඩමුළුව |
| අගෝස්තු | - යුධ හමුදා ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ නිළධාරීන් සඳහා |
| නොවැම්බර් | - නව මලල ක්‍රීඩා සංචිතය |
| දෙසැම්බර් | - යුධ හමුදා වුෂු සංචිතය |

**<u>ආහාර සටහන් ලබාදීම (තනි වශයෙන් හෝ සංචිත වශයෙන්)</u>**

| | |
|---|---|
| ජනවාරි | - ආහාර සටහන් (තනි පුද්ගල) -11 |
| පෙබරවාරි | - ජාතික මලල ක්‍රීඩා සංචිතය |
| | යුධ හමුදා ක්‍රීඩා සංචිතය |
| මැයි | - කොළඹ නාලන්දා විද්‍යාලයේ පිහිනුම් තරඟකරුවන් 13 දෙනෙකු සඳහා |
| ජුලි | - ජාතික මලල ක්‍රීඩා සංචිතය |
| ඔක්තෝම්බර් | - ජාතික පාපැදි සංචිතය |
| දෙසැම්බර් | - කාන්තා ක්‍රිකට් කණ්ඩායම |
| | වයඹ සරසවි සිසුන් |

**ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ අංශය**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් නිසි ශාරීරික යෝග්‍යතාවයන්ගෙන් යුක්ත දැයි පරීක්ෂා කිරිම සඳහා මෙම සේවාව පැවැත්වේ. කණ්ඩායම් වල අවශ්‍යතාවය මත හෝ ආයතනික අවශ්‍යතාවය මත ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙම පරීක්ෂණ සඳහා සම්බන්ධ වේ.

- $VO_2$ Max පරීක්ෂණ පැවැත්විම හා සම්බන්ධ දත්ත

2015 වසර තුල මෙම පරීක්ෂණ 21 ක් පවත්වා ඇත.

**කායික යෝග්‍යතා පරීක්ෂණ**

| මාසය | සංචිතය | ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගණන |
|---|---|---|
| ජනවාරි | දැල්පන්දු (යුධ හමුදා) | 28 |
| පෙබරවාරි | පාපන්දු (පිරිමි)<br>ඔරු පැදීම<br>වෙඩි තැබීම<br>දැල්පන්දු (යුධ හමුදා) | 28<br>19<br>23<br>28 |
| මාර්තු | පැසි පන්දු<br>සවි එසවීම | 15<br>08 |
| අප්‍රේල් | වෙඩි තැබීම (යුධ හමුදා) | 14 |
| මැයි | පාපන්දු (පිරිමි)<br>දැල්පන්දු (යුධ හමුදා) | 29<br>20 |
| ජුනි | දැල්පන්දු<br>හමුදා දැල්පන්දු | 13<br>21 |
| ජූලි | පාපන්දු | 23 |
| අගෝස්තු | රගර්<br>දුනු පැනීම<br>ජීවිතාරක්ෂක | 16<br>19<br>01 |
| සැප්තැම්බර් | දැල්පන්දු (යුධ හමුදා)<br>දැල්පන්දු (කණිෂ්ඨ) | 19<br>18 |
| ඔක්තෝබර් | වොලිබෝල් (පිරිමි)<br>කබඩි (පිරිමි)<br>කබඩි (ගැහැණු) | 18<br>26<br>24 |
| නොවැම්බර් | පාපැදි (පිරිමි)<br>පාපැදි (ගැහැණු) | 14<br>13 |
| දෙසැම්බර් | බැඩ්මින්ටන් | 23 |
| **එකතුව** | | **460** |

**ඖෂධාලිය සේවා සැපයීම් අංශය**

සම්ප්‍රදායික ඖෂධාලයකට වඩා ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ඖෂධාලය වෙනස් වේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය විවිධ වු විටමින් වර්ග සහ ඖෂධවලට අමතර පෝෂක සැපයීම ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ඖෂධාලයෙන් සිදු කරනු ලැබේ.

**ක්‍රීඩා වෛද්‍ය ආයතනය වෙත පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට නිකුත් කරනු ලබන ඖෂධ වර්ග**

| මාසය | Calcivita (cap) | Vitamin E (cap) | Guardian (cap) | Creatine (g) | Gatorade | Forceval (cap) | Ferrovit (cap) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2197 | 1615 | 2441 | 7175 | 01 | | | 13429 |
| පෙබරවාරි | 2045 | 2370 | 3360 | 1700 | - | | | 9475 |
| මාර්තු | | 2685 | 3360 | | | | | 6045 |
| අප්‍රේල් | 3038 | 2340 | 4328 | 10500 | | | | 20206 |
| මැයි | 1440 | 950 | 1177 | | | | | 3567 |
| ජුනි | 4176 | 3606 | 4336 | | | | | 12118 |
| ජුලි | 2010 | 1342 | 790 | | 28 | | | 4170 |
| අගෝස්තු | 3480 | 2580 | 3870 | 5550 | 20 | | | 15500 |
